

# අංගුලිමාල සූත්‍රය

# Angulimala Suttraya.

# අඞ්ගුලිමාල සූත්‍රය

පුරාණ.

පදාර්ථ සන්න සහිතයි.


වේයන්ගොඩ සදානන්ද පිරිවෙන් වැසි

ශිරීඳර රතනජෝති

ස්වාමීපාදයන් වහන්සේ විසින්


ලිපිදෙස් පහකොට සකස්කරණලදී.


ඩී. ජේ. සුබසිංහ අප්පුහාමි

විසින්

දිනකරප්‍රකාශ මුද්‍රාඞ්කණයෙහි අච්චුගස්වනලදී.

2435.

1891.

# සංඥාපනය.

අඞ්ගුලිමාලසූත්‍රයනම්වූ මෙම ප්‍රශස්ත ධර්මකොට්ඨාසය මජ්ඣිමනිකායට ඇතුලත් රාජවර්ගයෙහි සවෙනි සූත්‍ර දෙශනාවවේ.

ඊටම පුරාණ පණ්ඩිතාචාර්යවරයෙක් විසින් කරනලද මෙම පදාර්ථසන්නය සහ එසේම හෙලදිව් බසින් ලියනලද අඞ්ගුලිමාල මහරහතුන්වහන්සේගේ උත්පත්තිකථාවද අනර්ඝතවූ මෙම පොත සර්වඥ්‍යධර්මදෙශනාවෙහි නියුක්ත භික්ෂු සාමණේරයන්වහන්සේලාවිසින් බොහෝකලක පටන් පුරුදු පුහුණුකරගෙනඑන නමුත් චිරාගතලෙඛක දොෂයන්ගෙන් ගහණව තිබෙන බැවින් ශුද්ධවූ පොතක් මුද්‍රණයකරවා ප්‍රසිද්ධකළහොත් අලුත ඉගෙනගන්නන්ට ඉතා ප්‍රයෝජනවත්වේයයි ධර්මදෙශනාවෙහි දක්ෂ විචක්ෂණ මාතලේ රතනජෝති ස්වාමීන්වහන්සේ විසින් සම්මතකළ හෙයින් උගත් ගිරිදර රතනජෝති ස්වාමීන්වහන්සේලවා සකස්කරවාගෙන මෙසේ මේපොත අප විසින් මුද්‍රණයකරවනලද්දේය.

මෙමසූත්‍රයට ඇතුලත් "යතොහං භගිනි අරියාය ජාතියා ජාතො නාභිජානාමි සඤ්චිච්චපාණං ජීවිතාවොරොපෙතා තෙනසච්චෙන සොත්ථිතෙහොතු සොත්ථිගබ්භස්ස" යනමේ මහානුභාවසම්පන්න අඞ්ගුලිමාල පිරිතෙන් ගර්භිණීන්ට පැමිණෙන මූල්හගර්භාදි නොයෙක් රොගවලට පැන් ආදිය මතුරදීමෙන් උතුම්පිහිට ලැබියහැකි බැවින්ද පුරිසදම්මසාරථිසංඛ්‍යාත බුද්ධගුණය පිළිබඳ මේ ධර්මදෙශනාව භාවිතාකිරීමෙන් ස්වර්ග මොක්ෂ සම්පත් ලැබීමට හෙතුවන බැවින්ද උභය ලොකාර්ථසංසිද්ධිය පතන්නාවූ සකලබෞද්ධ මහජනයාටම මෙමපොත අතිශය ප්‍රයොජනවත්වේයයි සිතමු.

මෙවගට,
ඩී. ජේ. සුබසිංහ අප්පුහාමි.

වර්ෂ 1891 ක්වූ අගොස්තු මස
25 දින බැණ්ඩියමුල්ලේදීය,

# අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේගේ උත්පත්ති කථාව.

අප මහා ගෞතම සර්වඥයන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි සැවැත් නුවර රජකරණ කොසොල්මහ රජහට අර්ථධර්මානුශාසනාකරණ "ගර්ගී" නම් පුරොහිත බ්‍රාහ්මණයෙක්වෙයි. ඔහුගේ "මන්තානි" නම්වූ භාර්ය්‍යාවක්දවූව. ඕතොමෝ ඔහු නිසා රූවත් පුතනුකෙණකුන් ප්‍රසූතකලාහ. ඔහු උපන් කෙණෙහි රජහුගේ මඟුල්කඩුව ආදිවූ මුලුනුවර ආයුධයෝ දිලිහීගියහ. පෙරවි බමුණු දරුහෙයින් නැකත්තරු බලනුයේ "සොර නැකත සම්භව තිබෙන බැවින් මොහු සොරෙක්වෙ"යි සිතීය.

ඉක්බිත්තෙන් දෙවනදවස් උදෑසන රාජසේවයට ගිය පෙරවි බමුණුද 'මහරජ රෑදවස් ගියසේ සුවදැ'යි විචාලේය. එබසට කොසොල්රජ කියනුයේ 'ආචාරිනි ; සුවයෙක්නම් කොයින්ද රාත්‍රිභාගයෙහි මාගේ ඉස්දෞර තිබූ මඟුල්කඩුව දිලිහීගිය. එහෙයින් රාජ්‍යයට හෝ දේවියට හෝ වන අනතුරයෙකැයි සිතා නොනිදම පහන් කෙලෙමි'යි කීහ. ඒඅසා පෙරවි බමුණු කියනුයේ 'මහරජ ! ඒ අනිකෙක් නොවෙයි මාගේ ගෙයි බමුණු කුමාරයෙක් උපන. ඔහුගේ ආනුභාවයෙන් ඔබගේ මඟුල්කඩුවම නොවෙයි. මුලු නුවර සියලුම ආයුධයෝ දිලිහිනැ'යි කීහ. 'ආචාරිනි ඉන් වැඩ කින්දැ'යි විචාරන්නාම 'මහරජ ! ඔහු සොරෙක්වෙ'යි කීහ.

මෙසේ කියා රජහු සිත්ගන්නා පිණිස 'මහරජ ! ඔහු වලදමාපියම්'යි කීහ. 'ආචාරිනි ! ඔහු මතු සොරෙක් වෙයිහෝය. බොහෝ සොරුන්ගෙණ රට නසනා සොරෙක්හෝ'යි පිළිවිත. 'මහරජ ! එක සොරෙක්වෙ'යි කීයෙන් 'ආචාරීනි එක සොරෙක්වීනම් කුමක් කෙරේද ඔහු පෝෂ්‍යයකරව'යි කීය.

ඉක්බිත්තෙන් බ්‍රාහ්මණතෙම 'යහපතැ'යි කියා ගෙට ගොස් ඕහට 'අහිංසක කුමාරය'යි නම්තබා මනාකොටපිළිදග්ගෙන් සොලොස් ඇවිරිදිවූකල්හි 'ශිල්ප උගන්වය'යි කියා තක්සලා නුවරට යවීය. ඔහු ගොස් දිසාපාමොක් ආචාරීන්දැක ධර්මාන්තේවාසීව ශිල්ප උගන්

ට වත. ඒ ආචාරීන්ට ඉතා කීකරුය. කී කී දෑ වහ වහා කෙරෙයි. සිත්සේ වෙසෙයි, ප්‍රිය තෙපුල් බෙණෙයි. ආචාරීහු ඕහට සිනෙහැතිවූහ.

ඉක්බිත්තෙන් ශිල්ප උගන්වාගොස්සිටි සෙසු දරුවෝ අහිංසක කුමාරයන්කෙරෙහි ඊර්ෂ්‍යාඇතිව 'මොහු ආතැන්පටන් අපගේ ආචාරීන්වහන්සේට ඔහු මිස අප නොපෙනෙන්නාක් වැනිවිය. කුමක් කොට ඔහු ආචාරීන්කෙරෙහි බිඳුවාපියමෝද්ද'යි මන්ත්‍රණය කරන්නාහු 'ඔහු'නොමැලිහෙයින් කුමකුත් නොකෙරෙයි. කීයනොහැක්ක කුලවත්හෙයින් අකුලීනයයි කීයනොහැක්ක. නුවණැතිහෙයින් මුග්ධයයි කීයනොහැක්ක. එසේදවුවත් ආචාරීන්වහන්සේගේ භාර්‍ය්‍යාව හා අනාචාරයෙහි හැසිරෙති කියාලා බිඳුවාපියහැක්කැ'යි ඔවුනොවුන් හා සතිකාකොට මේ කෝලාම ගොතාගෙණ ඔහු පන්සියක්දෙන තුන්කොටසක්ව බෙදී පළමුවන කොටස ආචාරීන් කරාගොස් දැක වැඳ 'ආචාරීන්වහන්ස දත් වුවමනා දෙයක් ඇතැ'යි කිවුය. 'දරුවෙනි කියව'යි කියන්නා 'ආචාරීන්වහන්ස අහිංසක මානවකයා ඔබවහන්සේගේ භාර්‍ය්‍යාව හා අනාචාරයෙහි යෙදෙති'යි කිවුය. එබසට ආචාරීහු ඔවුන්ට උදහස්ව 'මදරු එබන්දක් නොකරති තෙපි යව'යි ඔවුන් පැලවීය. නැවත අනික් දවසෙක දෙවන කොටස ගොස් පළමු පරිද්දෙන්ම කියන්නාහු 'ආචාරීන්වහන්ස! අහිංසක කුමාරයා ඔබවහන්සේගේ භාර්‍ය්‍යාව හා සසඳ ඇත්තේය'යි කිවුය. ඔවුන්ටද නොසතුටුව 'තෙපි යව ඔහු එබන්දක් නොකරෙති'යි ගිවිස්ස.

ඉක්බිත්තෙන් අනික් දවසෙක තුන්වෙනි කොටස ගුරුන්කරා ගොස් වැඳ පළමුසේම කියන්නාහු 'අහිංසකයා ඔබවහන්සේගේ භාර්‍ය්‍යාවහා සඞ්ග වරදවා පිළිපදිති'යි කිවුය. ආචාරීහු ඔවුන්ට දැහැවී තෙපි යව ඔහු එබඳු නොකලමනා දෙයක් නොකෙරෙති කීහ. ඔහුද යන්නෝ 'ආචාරීන්වහන්ස අප කීද්ද සැබෑ බොරුබව කල්යාමකින් වේද්ද'යි කියා කුකුස්කරවා ගියෝ,

ආචාරීහුද මද මද සැකසිතා 'වන්නාට මුන්ගේ බසෙහි සැබෑ නොසැබෑ දෙක විමසා බැලුව මැනවැ'යි පරීක්ෂාකරන්නෝ ඈ හා ඕ ප්‍රිය තෙපුල් කියන්නා අසා 'අරුන් කීයේ සැබව"යි සිතා කාමකෝපයෙන් කිපියේ 'මොහු මරාපියම්'යි සිතීය. මෙසේ සිතා තමන්ද නුවණ ඇතිබැවින් ඉදින් මම් මොහු මැරුයෙම්විම්නම් 'දිසාපාමොක් ඇදුරු කරා ශිල්ප පිණිස ගිය කුලදරුවන් නිවරදයේ වරද පිහිටුවා මරන්නේය'යි ඔබත් ප්‍රසිඛවෙයි. එකල්හි මා කරා ශිල්ප පිණිස එන්නෝ මදවෙති. ඔවුන් නොඑනකලට උපදනා ලාභ

සත්කාර මදවෙයි. එහෙයින් යම්කිසි උපායකින් මොහු මැරුව මැනවැ'යි සිතන්නේ 'ශිල්පයට උපචාර පිණිස මිනිසුන් දහසක් මරා එව'යි කියමි. 'ඔහු එසේකරන්නාහු ඔවුන් අතුරෙන් එක්කෙණෙක් ඔහු මරාපියති'යි මෙසේ සනිටුහන්කොට ඔහු ලඟට කැඳවා පුත ! අහිංසකය ! දහසක් මිනිසුන් මරා එහි ශිල්පයට උපචාරය'යි කීවුය. ආචාරීන්වහන්ස මම අන්නට හිංසානොකරණ කුලෙහි උපනිමි, එහෙයින් කෙසේ මිනිසුන් මරම්දැයි කීය. 'පුත ශිල්පයට උපචාර නොකරන්නා ශිල්පය නොලබ'යි කීවුය. 'එසේවී නම් එලෙස කෙරෙමි'යි කියා ගුරුන්වැඳ සවුගෙන ධනු මුද්ගරාදිවූ පඤ්චායුධසන්නාහබව වනයට වැද අටවියට වදනා තැන්හා අටවිමධ්‍යයෙහිද අන්තයෙහිදැයි මෙතුන්තැන රුකසිට වනමැදින් යන එන්නන් මරයි. වස්ත්‍රාභරණාදිවූ කිසිවස්තුවක් නොගෙන ගණින් පමණ ගනියි. සතුන් මරන්නහුගේ සිත ක්‍රොධ වෙසයෙන් කැලඹී හෙයින් කල්යත්යත් මැරූ මිනිසුන් මෙතෙකැයි ගණන්මුළාවිය. එහෙයින් එතැන්පටන් එක මිනිසකුගෙන් එකඇඟිල්ලක් බැගින් ඇඟිලිකපා ඒ ඒ තැන තබයි. හෙද අපත්වනහෙයින් පසුව කපා ගත් ඇඟිලි වැලක අවුනා මාලාවක්මෙන් ගෙලෙන් දරයි. එහෙයින් ඕහට 'අඞ්ගුලිමාල සොර'යයි නාම ව්‍යවහාරවිය.

ඔහු රාත්‍රිභාගයෙහි ගම්වැද පයවිළුඹෙන් ඇන දොරබා බිඳ ගෙවලටවැද එහි නොත්තන් මරා ඇඟිලි කපාගෙනයයි. එහෙයින් ගම්වැස්සෝ සියලු ගෙවල් හැරපියා දරුබිලිඳුන් හා හස්තසාර වස්තුගෙණගොස් නියම්ගම්වන්හ. නියම්ගම් වැස්සෝද එසේම නොස් නුවර වටා කඳවුරු බැඳසිටියෝ.

ඉක්බිත්තෙන් එක්දවසක් ලොවැසිදනෝ රාජාඞ්ගනවාරයෙහි රැස්ව සිට කියන්නාහු 'දෙවයන්වහන්ස ! ඔබවහන්සේගේ ආඥාව පවත්නාවූ රාජ්ජයෙහි අඟුල්මල් නම් සොරෙක්වෙයි. හේ දුටුවන් මරයි. මෙසේ වනමැදින් යන ගමන්නැතිකලෝ. දරපලා සඳහා ද ඒවනයට යන්නෝනැත. හැමගම් අගම්කළේ· නියම්ගම් අනියම් ගම්කළේ. දනවු නොදනවුකළේ. සව්ජනයන්ට භයසන්ත්‍රාශ උපදවයි. මෙසෙයින් ලොවට පැමිණසිටි භය දුරුකරණසේක්ව'යි මහහඬින් මුරගා සිටියෝ. එපවත් ඇසූ කොසොල් රජ ඔහු මරාපියව්''යි විධානකළේ. එකල්හි ලඟසිටි පුරොහිත බ්‍රාහ්මණතෙම එපවත් අසා තමාගේ ගෙටගොස් බැමිණියට කියනුයේ 'සොඳුර ! අඟුල්මල්නම් සොරෙක්වූල. හේ අනිකෙක් නොවෙයි, තොපපුත් අහිංසක කුමාර වෙයි. රජතෙම ඔහු මරන්ට නියොගකළේය. කුමක් කරමෝද්දැ'යි කීය, එබසට බැමිණි කියන්නී 'ස්වාමිනී ! තොපිගොස් මපුතු කැඳවා

ගෙණෙනව'යි කීව. 'සොඳුර ! මේලොකයෙහි සතරදෙනෙක් නොවිස්වස. පළමු තමා අතට හුන්කොල අස්න නොවිස්වස. කෙතෙක් සම්පත් දුන්නත් රජහු නොවිස්වස. දසදරුකෙනකුන් ලදත් ස්ත්‍රීහු නොවිස්වස. පෙර මිතුරුකම්ඇත්තාවූ සොරහු නොවිස්වස. සොඳුර ලෝ විශ්වාසයට නොගතයුතු මේ සතරදෙනා අතුරෙන් ඔහු එකෙක් වන බැවින් මම් යානොදහැක්කෙමි'යි කීහ. එබස්අසා මවුන්ගේ ලැය මෙලෙක් හෙයින් 'මාගේ ජීවිතයට කුමක්වෙතත් මපුතු රැකලම්'යි නික්මුණය.

එදවස් අලුයම්වේලෙහි බුදුහු මහ කුළුණු සමවතින් සම්වැද මුළුලොව බලනසේක් අඟුල්මල් සොරහු දැක මම් දැම්ම ඔහු කරා ගියෙම්වීම්නම් මාගෙන් සතරපදයකින් බනඅසා මහණව රහත්ව අමාමහ නිවන්දකිතියි නොගියෙම්වීම්නම් මව මරා අවීචිමහනිරයේ ඉපද අතුරුකපක් විඳිනා දුකට භාජනවෙයි. බුදුඇසින් දැක පෙරවරු සැවැත්නුවර පිඬුසිඟා වළඳා විහාරයට වැඩ ඔහු කෙරෙහි කරුණාවෙන් එකචාරි සිංහරාජයක්හුමෙන් එකලාව ඔහු කරා වඩනාසේක. එසේ වඩනා බුදුන් දුටු ගවපාලයෝද වස්සන් රක්නෝද ගොවිහුද මග යනඑන්නෝද බුදුන් නොහැඳින මහණතෙල මග නොයා ඒ මාර්ගයෙහි අඟුල්මල් සොරෙක් ඇත්තේය. හෙතෙම දරුණුය හැම්වේලෙහිම ලේවැකුණු අත්ඇත්තේය. සතුන්කෙරෙහි කුළුණු නැත්තේය. ගම්නොගම්කෙළේය. නියම්ගම් නොනියම්ගම් කෙළේය. දනවු නොදනවුකෙළේය. දුටු මිනිසුන් මරා ඇඟිලි කපාගෙන ඒ විද මාලාවක් මෙන් දරයි. තෙලමග පුරුෂයෝ දසදෙනකුද විසි තිස් සතළිස් පණස්දෙනෙකුදු සමගවයෙති. ඔහුද සැකඇතිව යන්නාහුවෙති, අඟුල්මල්සොරහට අසුව විනාශයට යෙතියි කියා මෙසේ දෙතුන්වැනිව කීසඳීත් බුදුහු ඒ නොඇසෙනකලක්මෙන් නොසරුකොට එමමග වැඩ අඞ්ගුලිමාලයන් සිටි වන පෙදෙස් වැලනට පැමිණියෝ.

ඔහුද බොහෝදවසක් දුඃඛාහාර දුඃඛසෙය්‍යාදියෙන් උකටලීව එකඟිල්ලකින් දහස පිරෙණහෙයින් 'එදවස් පළමුකොට දුටුකෙනකුන් මරා ඉන් ඇඟිලිදහස පුරාගෙනගොස් ගුරුන්දැක ශිල්පයට උපචාරකොට ඉස්සෝදා නහා සුදු පිළි හැඳ නෑසියන් මැද සුවසේ වෙසෙම්'යි සිතා අටවිමුඛයට පැමිණි මගින් ඉවත්ව සිටියේ එකලාව වඩනා බුදුන්දැක විස්මිතව 'මේමග පුරුෂයෝ දස විසි තිස් සතළිස් පණස්දෙනකුදු මුළුමුළුව එන්නෝ පවාත් මා අතනාසිති; එන කුදුළුවත් මේමහණ මා අභිභවමින්මෙන් එකලාවඑයි. මොහු මැරුව මැනවැ'යි සිතා කඩුපලඟ හා සමග පඤ්චායුධසන්නද්ධව ආපසු

වඩනා බුදුන් පසුපස්සෙහි ලුහුබැඳගත. එකෙණෙහි බුදුහු 'අඟුල්මල්සොරා යථාශක්තීන් ලුහුබඳනේ පියවිගමණින් යන මා හා සමග වන්න නොහැකිවේවා'යි අධිෂ්ඨානකළහ. එම්ඉටත්බෙලෙන් ඔහු දිවනතැන්හා බුදුන් වඩනා දෙඅතුර මහපොළොව මුහුද රැළනැගී බස්නාක්හුමෙන් සොරහු පසුබාපියයි. හිසනක් තැන් බුදුන්ට ලංවිය නොදෙයි. නැවත බුදුහු ඉදිරියෙහි මහත් මලුවක් දක්වති, එහි බුදුහු මධ්‍යගතසේක්වීනම් සොර පසුකෙළවරවෙයි. බුදුහු පූර්වකෙළවරවූසේක්නම් සොර මධ්‍යගතවෙයි. නැවත සොරහු දැන්ම බුදුන් ලංකෙරෙමියි මෙතනදීම හසුකෙරෙම්යි සිතසිතා දොළොස් ගව්වක් තැන් ලුහුබැන්දේය. බුදුහු පෙරට වලක්හෝ ගොඩක්හෝ දක්වති, වළින් නැගී ගොඩින් බැසයන්නාහුගේ මඳ මඳ ගමන්වෙයි. මෙසේ ඔහු "මෙතනදීම බුදුන් හසුකෙරෙමියි මෙතනදීම බුදුන් ලංකෙරෙම්"යි දොළොස් ගව්වක්තැන් දිවපියා, විඩාව කටකෙලසිඳී ඇඟඩා සෙල්වී කළාන්තවූ ශරීරඇත්තේ මෙසේසිතී. අහෝ කිමෙක්ද පෙර මම දිවන ඇතුන්ද දිවන අසුන්ද දිවන රථද දිවන මුවන්ද ලුහුබැඳගොස් අල්වාගතිමි, පියවිගමණින්යන මේ මහණ බලපමණින් දිවේනම් සමීපවන්නට නොහැක්කෙමි සිතා තෙමේ සිටියේ 'සිට මහණ! සිට මහණ'යි කී. එබසට බුදුහු 'මමද සිටියෙමි, තෝද සිටුව'යි වදාළෝ,

එසඳ අඞ්ගුලිමාල තෙම කියනුයේ 'මහණ! තෝ යෙමින් සිට සිටියෙම්'යි කියයි. සිටියාවූ මට 'තෝද සිට'යි කියයි. එයට කරුණු කිම්දැයි විචාළේ. එබසට බුදුහු වදාරණසේක් 'අඞ්ගුලිමාලය! හැම සතුන්ට හිංසා පිණිස ගන්නාලද දණ්ඩමුද්ගරාදියක් කිසිකලෙකත් නොගෙන හැමකලම ක්ෂාන්ති මෛත්‍රියෙහි පිහිටා සිටිහෙයින් මම සිටියානම්වෙමි, මෙතෙක් දහස්ගණන් සතුන් මරණතෙක් එකදවසකුදු මෛත්‍රියෙහි නොපිහිටි හෙයින් තෝ නොසිටියානම් වෙයි. දැන් තෝ ඉරියව්විසින් සිටියේද තාවිසින් කරණලද අකුශල විපාකයෙන් සතරඅපායෙහි ඇවිදිනා හෙයින් තෝ නොසිටියෙ'යි වදාළෝ.

එකල්හි අඟුල්මල්සොර සිතනුයේ 'මෙවැනි සිංහනාදයෙක් අතීතක්හට ඇත්තේනොවෙයි. මහාමායාදේවීන් පිත් මහා මහණ රජහුගේ ගර්ජනාවූවමැනව. සූක්ෂමවූ බුද්ධිඇති බුදුන් විසින් මා දක්නාලදුව මට වැඩපිණිස බුදුහු මෙයට වැඩිසේක්වන, දෙවිමිනිසුන් විසින් පුදනලද මේ සර්වඥවරයන්වහන්සේ බොහෝකලකින් මට කරුණාසඳහා වැඩියහ. ඔවුන්ගේ මධුරධර්මකථා අසනලද මාවිසින් අදපටන් පවුනොකෙරෙමි'යි කියා තමා අතතිබූ පඤ්චායුධය එක්තරා දූදුරෙක්හිදමා අමාවිලෙක ගැලෙන්නාක්හුමෙන් බුදුන්ගේ ශ්‍රීපාද

මූලයෙහි වැඳවැතිර "සකලජන පතල කරුණා නිධානවූ සර්වඥ රාජෝත්තමයාණන්වහන්ස මා මහණකොට වදාළමැනවැ'යි ආරාධනාකෙළේය.

එසඳ බුදුහු ඔහුගේ පූර්වචරිතය පරීක්ෂාකොට බලාවදාරා ඒහිභික්ෂුභාවයෙන් පැවිදිකොට ඔහුලවා පාසිවුරු ගෙන්වාගෙන ක්‍රමයෙන් සැරිසරා වඩනාසේක් සැවැත්නුවර ජේතවනාරාමයට වැඩ එහිවාසයකරණසේක. එදවස් යටකියනලද "මන්තානි" නම් බැමිණිතොමෝ ඔහු සිටි වනයට ගොස් අටඉස්බක්තැන් කැලෑමැද ඇවිද 'පුත අහිංසකය කොයිසිටියෙහිද කොයි හුන්නෙහිද කොයට ගියේද කුමක්නිසා මාහා නොබණේද'යි කියා විමසාබලා ඇවිද නොදක්නී පෙරලා තමාගේ ගෙටම ගියාය.

නැවත එක්දවසක් ලොකවාසීහු රජගෙයි වාසල්දොර සමීපයෙහි රැස්වසිට "දෙවයන්වහන්ස ! ඔබගේ විජිතයෙහි අඞ්ගුලිමාලනම් සොරෙක්විය. හෙතෙම තදක්‍රෑරවූඑකෙක හැම සතුන් කෙරෙහිම කුළුණුනැත්තේය. සතතයෙන් සත්වඝාතනය කරන්නේය. එහෙයින් හැමවේලෙහිම ලේවැකුණු අත් ඇත්තේය. ගම් නොගම්කෙළේය නියම්ගම් නොනියම්ගම්කෙළේය. දනව් නොදනව්කෙළේය. දුටුදුටුවන් මරා ඇඟිලිකපාගෙන ඒවිද මාලාවක් මෙන් දරයි. අප මහරජාණෙනි ඔහුගෙන් වන්භය වළකාපියනසේක්වා"යි කියාමහහඬින් ගුගුලෝ.

ඒඇසූ කොසොල්මහරජතෙම සිතනුයේ 'මෙයට පළමුවෙන් ඔහු හසුකරවයි කියා ඇතුන් අසුන් රථසාදදී නොයෙක්වර යොධභටයෝ යවීම්. ඔහුගොස්වන්කල්හි ඒසොර 'මම අඞ්ගුලිමාලයෙ'යි කියා මහත්කොට ශබ්දපවත්වයිල. එකෙණෙහි මිනිස්හු විසංඥවූවන්මෙන් මුලාවවැටෙත්ල. ඇත්හුද අස්හුද බියපත්වූවාහු වල්වැදඅස්වෙතිල. රථ ඒඒතැන තිබියදීම දිරයේල. "එහෙයින් මාම යායුතුය'යි සිතා පන්සියක් අසුන්හා චතුරඞ්ගිනීසෙනඟින් උපලක්ෂිතව සොරැකෙරෙහි භයින් යානොහැකිවේද ගර්හාබියෙන් යනුයේ බුදුන්දැක ගියමැනව එතැන්හි ගියමම් බුදුන්වැඳහුන්කලට "කොයියයි මහරජ"යි බුදුහු විචාරණසේක. එකල්හිමම් 'අඟුල්මල් සොරහු අල්වාගන්ටයෙම් ස්වාමීනි කියම්'යි ඉඳින් සොරැට ජය මට පරාජයවෙයිනම් 'මහරජ් තෙලගමන් නොය'යි වදාරණසේක. එකල්හි 'අඟුල්මල් සොරහු අසුකරන්ටයන කොසොල්මහ රජහු බුදුහු නවතාලූසේකැයි ඔබත් ප්‍රසිද්ධවෙයි. එහෙයින් ගර්හාත්නොදවෙති'යි සිතා දෙව්රම්වෙහෙර ගියේ බුදුන්වැඳ එකත්පස්ව හුන්නේය.

එකල්හි බුදුහු වදාරණසේක් 'මහරජ ! තොපට බිම්සර රජ කිපියේද නොහොත් විශාලාමහනුවරවාසීවූ ලිච්ඡවිරජදරුවෝ කිපි

සාහුද නැතහොත් අන්සතුරු රජකෙණෙක් කිපියාහුද්දැ'යි විචාරා වදාළසේක. එබසට කොසොල්රජ දන්වනුයේ ස්වාමිනි භාග්‍යවතුන්වහන්ස ! මට බිම්සර රජද නොකිපිසේක. විශාලා මහනුවර වැසි ලිච්ඡවීහුද නොකිපියහ. අනෙක් සතුරුරජකෙණෙක්ද නොවූයේය. එතකුදුවුවත් කොසොල්රට වැසියන්ට අඟුල්මල් නම් සොරකුගෙන් භයෙක් පැමිණසිටියේය. ඒභය දුරුකරණු පිණිස ඔහු කරායෙමි ස්වාමිනියි කීහ.

ඉක්බිත්තෙන් බුදුහු වදාරණසේක් 'මහරජ ඉදින් අඞ්ගුලිමාලයන් ඉසකෙස් දැළිරැවුලු කපාහැර තුන්සිවුරු හැඳ පෙරව ප්‍රාණඝාතාදී හැමපවින් දුරුව කල්‍යාණගුණධර්මයෙහි පිහිටාසිටියාහු දුටුනම් ඔහට කුමක්කරාද්ද''යි විචාරා වදාළසේක.

එබසට කොසොල්රජ දන්වනුයේ 'ස්වාමිනි ! උන්වහන්සේට වඳිම්හ පුදම්හ. දැක හුනස්නෙන් නැඟීසිටිම්හ. ඉදිනා අසුන්දෙම්හ සිව්පසයෙන් උපස්ථානකරම්හ'යි කියා නැවත කියනුයේ 'ඉදින් බුදුහු මාස්යන ගර්භා තෙපුල්නිසාඋවත් අඟුල්මල් සොරා මහණ කළසේක්වීනම් ලොවටද නිසියයි. ඔහුහා කරණ යුද්ධයත් නැත එබැවින් මටද පහසුවෙ''යි සිතා ස්වාමිනි ! එබඳු පව්වූ අදහස්ඇති දුශ්ශීලවූ තදකෲරවූගුණ ඇති ඔහට එබඳු කල්‍යාණ ගුණධර්මයෙක් කෙසේනම් පිහිටාද්දැ'යි කීහ.

ඉක්බිත්තෙන් බුදුහු දක්ෂිණහස්තය දිගුකොට 'මහරජ ! තොලසිටිනේ අඞ්ගුලිමාලයෝය'යි වදාළසේක.

එකෙණෙහි කොසොල්රජ මහත්වූ භයින් වෙවුලා ගියේය. සොරහුහා යුද්ධයටගිය රජපිරිස 'අඞ්ගුලිමාලය'යි යනවචනය කණවැටෙත් මහත්භයින් තැතිගෙන තමතමන් ගෙනගිය ආයුධ ඒ ඒ තැනදමාපියා වහවහා නුවරට දිවගොස් තමතමන්ගේ ගෙවලට වැද දොරපියා අගුලුලා මතුම්හලටනැගී පසුපස්සෙහි සොරහු එනනියාදෝහෝයි සැකඇතිව ආපසුබලමින් සිට කියන්නාහු 'කොසොල්රජ මහසෙනඟ සමගින් මා කරාඑයි. හෙද දෙව්රම් වෙහෙරට අවුත්එන්නේයයි දත් අඟුල්මල්සොර පළමුකොට අවුත් දෙවුරම් වෙහෙර සිටියේවන. අප මහරජහු ඔහට අසුවිය. වහවහා දිව ආහෙයින් අපහැම්දෙන දිවිලදුම්හ'යි කියකියා සිටියෝ.

ඉක්බිත්තෙන් සකලලොකානන්දකරවූ සර්වඥයන් වහන්සේ කොසොල්රජහට භයසන්ත්‍රාසාදිය උපන්බව දැන සත්ත්වශයෙන් කුරු කුහුඹුවකුටපවාත් තෙල අඞ්ගුලිමාලයන්ගෙන් භයෙක් නැතැයිනිශ්චයකළෝ.

# අඞ්ගුලිමාල සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යානය.

**නමොතස්සභගවතො**

**අරහතො සම්මාසම්බුද්ධස්ස**

1 එවම්මෙසුතං එකංසමයං භගවා සාවත්ථියං විහරතිජෙත වනෙ අනාථපිණ්ඩිකස්සආරාමෙ.

1 එවමෙමසුතං, මෙ, මාවිසින් මේඅඞ්ගුලිමාලසූත්‍රාන්ත ධර්මදෙශනාව; එවංසුතං, මේආකාරයෙන් අසනලද මෙසේ අසන ලද මෙසේ ම අසනලදී; එකංසමයං, [ගර්භාවක්‍රාන්ති සමය, ජාතිසමය, සංවෙගසමය, අභිනිෂ්ක්‍රමණ සමය, දුෂ්කරක්‍රියාසමය, මාරවිජය සමය, සම්‍යක්සම්බොධිසමධිගමකාලසමය, දෘෂ්ටධර්මසුඛවිහාරසමය, අත්තහිතපටිපත්තිසමය, පරහිතපටිපත්තිසමය, දෙශනා සමය, පරිනිර්වාණසමය, යනාදි දිව්‍යමනුෂ්‍යයන් කෙරෙහි ප්‍රකාශ සමයන් අතුරෙන් කරුණාකෘත්‍යසමය සඞ්ඛ්‍යාතවූ] එක් (ධර්මදෙශනා) සමයෙක්හි; භගවා, (සර්වානවද්‍යපරිහාර පූර්වඞ්ගමනිරවශෙෂහිතසුඛ විධානතත්පරනිරතිශයප්‍රයොගසම්පත්තියෙන් දෙව්මිනිසුන් සහිතවූ සර්වලොකයහට අත්‍යන්තොපකාරත්වයෙන්) භගවත්නම්වූ සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයාණන් වහන්සේ; සාවත්ථියං, (රන්රිදී මුතුමැණික් මරකත වෛඩූර්‍ය්‍ය මසාරගල්ල ලොහිතාඞ්ක සඞ්ඛසිලප්‍රවාලාදි නානාවිධ රත්න ගණකීර්ණ විස්ඵුරණ වාණිජ ජනශ්‍රෙණියෙන් සමලඞ්කෘත හෙයින්ද ශාලිව්‍රීහියවකඞ්ගු කුද්‍රූස වරකගොධූමය යන සප්තවිධධාන්‍යයෙන් සම්පූර්ණහෙයින්ද, ක්ෂෞමකෞශෙයාදි විචිත්‍ර පට්ටවස්ත්‍රයෙන් හා අතිකුදු මනුෂ්‍යයන්ට ප්‍රයොජනවත්වූ මධුරාන්නපානවර්ගාදිවූ සියලු උපකරණයෙන් සමෘද්ධ හෙයින්ද, "සර්වමස්ති" කීයයුතුතන්හි ශෛරුක්තිකවිධීන් "ශ්‍රාවස්තිය" යන නමින් ප්‍රසිද්ධවූ පුරන්දර පුරාකාර කොශලදෙශ තිලකායමානවූ පැවැත්මෙන්යුත් සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, [ජේතනම් රාජකුමාරයා විසින් රොපිතසංවර්ධිත හෙයින්] ජෙතවනනම්වූ; අනාථපිණ්ඩිකස්සආරාමෙ, සියලු අනාථ යාචකය

න්ට පිණ්ඩප්‍රදානය කරණහෙයින් අනාථපිණ්ඩිකනම්වූ මහසිටුහු
විසින් සිව්පණස්කෙළක් දනවියදම්කොට කරවා පිළිගන්වනලද
ජේතවන මහාවිහාරයෙහි; විහරති, (වෛනෙය ජනයන්ට ධර්මදෙ
ශනාකිරීමෙන්ද, නානාප්‍රකාර ඵලසමාපත්තියට සමවැදීමෙන්ද
සත්වයන්ට හා තමන්වහන්සේට විවිධවූ හිතසැප එලවමින් මෙ
ත්‍රී කරුණා මුදිතා උපෙක්‍ෂා යන චතුර්විධ ඊර්‍ය්‍යාපථ බ්‍රහ්මවිහරණ
යෙන් යුක්තව) වැඩවාසයකර වදාරණසේක.

2 තෙනඛොපනසමයෙන රඤ්ඤොපසෙනදිස්සකොසලස්ස විජි
තෙචොරොහොති අඞ්ගුලිමාලොනාම ළුද්දොලොහිතපාණිහතපහ
තෙනිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසුතෙනගාමාපි අගාමාකතා
නිගමාපි අනිගමාකතා ජනපදාපි අජනපදාකතාසොමනුස්සෙවධිත්වා
වධිත්වාඅඞ්ගුලීනං මාලංධාරෙති.

2 තෙනඛොපන සමයෙන, (යම්සමයෙක්හි බුදුහු ශ්‍රාවස්තිපුරය
ගොචරග්‍රාමකොට ජේතවනමහාවිහාරයෙහි වැඩවාසයකර වදාරණ
සේක්ද) එසමයෙහි වනාහි; පසෙනදිස්සකොසලස්සරඤ්ඤො, පසෙ
නදිකොසොල්මහරජහුගේ; විජිතෙ, ආඥප්‍රවෘත්තස්ථානයෙහි
හෙවත් කොසොල් ජනපදයෙහි; ළුද්දො, රෞද්‍රවූ; ලොහිතපාණි
ලෙහෙයෙන් වැකුණු අත්ඇත්තාවූ; හතපහතෙනිවිට්ඨො, සත්ව
යන් තැළීමෙහි හා මැරීමෙහි නියුක්තව සිටියාවූ; පාණභූතෙසු,
සකලප්‍රාණීන් කෙරෙහි; අදයාපන්නො, කරුණාවක් නැත්තාවූ;
අඞ්ගුලිමාලොනාම චොරොහොති, අඞ්ගුලිමාලනම් චෞරයෙක්
වන්නේය.

තෙන, ඒ අඞ්ගුලිමාලනම් චෞරයා විසින්; ගාමාපි, ග්‍රාමය
න්ද; අගාමාකතා, (මනුෂ්‍යයන්ගේ සඤ්චාරය වැළැක්ම හෙයින්)
අගම්කරණලද්දාහුය; නිගමාපි, නිගමග්‍රාමයන්ද; අනිගමාකතා,
(මනුෂ්‍යයන්ගේ සඤ්චාරය වැළැක්මෙන්) අනියම්ගම් කරණලද්දා
හුය; ජනපදාපි, (සමස්ත) ජනපදයන්ද, අජනපදාකතා, (මනුෂ්‍ය
යන්ගේ සඤ්චාරය වැළැක්මෙන්) අජනපදකරණලද්දාහුය; සො,
ඒ අඞ්ගුලිමාලනම් චෞරතෙම; මනුස්සෙ, මනුෂ්‍යයන්; වධිත්වාවධි
ත්වා, මරමරා; අඞ්ගුලීනංමාලංධාරෙති, අඞ්ගුලීන්සම්බන්ධව මාලා
වක් දරන්නේය.

3 අථඛොභගවා පුබ්බණ්හ සමයංනිවාසෙත්වා පත්තචීවරං ආ
දායසාවත්ථිං පිණ්ඩායපාවිසි සාවත්ථියං පිණ්ඩායචරිත්වා පච්ඡා

ඡාභත්තං * පිණ්ඩපාතපටික්කන්තො සෙනාසනංසංසාපෙත්වා † පත්ත චීවරංආදාය යෙන චොරො අඞ්ගුලිමාලොතෙනද්ධානමග්ගංපටිපජ් ජි අද්දසාසුංඛො ගොපාලකා පසුපාලකා කස්සකා පථාවිනො භග වන්තං යෙනචොරො අඞ්ගුලිමාලො තෙනද්ධානමග්ගං පටිපන්නං දිස්වා භගවන්තං එතදවොචුං මා සමණ එතංමග්ගං පටිපජ්ජ එතස්මිං සමණමග්ගෙ චොරොහොති අඞ්ගුලිමාලොනාම ළුද්දො ලොහිතපාණී හතපහතෙනිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු තෙනගාමාපි අගාමාකතා නිගමාපි අ නිගමාකතා ජනපදාපි අජනපදාකතා සො මනුස්සෙවධිත්වාවධි ත්වා අඞ්ගුලීනංමාලංධාරෙති එතංහි සමණ මග්ගංදසපිපුරිසා වීස ම්පිපුරිසාතිංසම්පිපුරිසා චත්තාරීසම්පිපුරිසා සංහරිත්වා සංහරි ත්වාපටිපජ්ජන්ති තෙපිචොරස්ස අඞ්ගුලිමාලස්ස හත්ථහත්ථං ‡ ගච්ඡන්තීතිඑවංවුත්තෙ භගවාතුණ්හීභූතොඅගමාසි.

3 අථඛො, එකල්හි; භගවා, භග්නකරණලද රාගාදික්ලෙශයන්ඇති හෙයින් භගවත්නම්වූ සර්වඥයන්වහන්සේ; පුබ්බණ්හසමයං, පෙර වරුඒක්ෂණයෙහි; නිවාසෙත්වා, (ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනසකිරීමෙන් දෙපට අඳනා සිවුර) ආච්ඡාදනයකොට; පත්තචීවරංආදාය, කයින් චීවරය හා ශ්‍රීහස්තයෙන් පාත්‍රධාතුවගෙන ඒකාංශව ප්‍රතිග්‍රහණය කොට; සාවත්ථිං, (යුගන්ධරචක්‍රාකාර ගොපුරවාරශත කවාටාභි රාම සුධාකර්ම නිර්මිත යුද්ධ ක්ෂමභූමිතල සම්පන්න සුරක්ෂිත ගොපුර වාර අට්ටාලශාලායෙන් මනොරම්‍යවූ නෛකජන සම්පත්ති යෙන් සම්පූර්ණවූ) ශ්‍රාවස්තිපුරප්‍රවරයට; පිණ්ඩායපාවිසි, පිඬු පිණි ස වන්සේක.

සාවත්ථියං, අමරපුර ශ්‍රීධරසකල නගරාඞ්ග සම්පත්තියෙන් සමෘ ද්ධවූ ශ්‍රාවස්තිපුර ප්‍රවරයෙහි; පිණ්ඩායචරිත්වා, පිඬුපිණිස හැසිර; පච්ඡාභත්තං, පස්වරු;| පිණ්ඩපාතපටික්කන්තො, ආහාරයෙන් වැළකීසේක්; සෙනාසනංසංසාපෙත්වා, සෙනසුන් තැන්පත්කො ට තබා; පත්තචීවරංආදාය, කයින් චීවරයහා ශ්‍රීහස්තයෙන් පාත්‍ර ධාතුවගෙන ඒකාංශව ප්‍රතිග්‍රහණයකොට; යෙන අඞ්ගුලිමාලො චොරො, අඞ්ගුලිමාලනම් චෞරතෙම යම්දිශාභාගයෙක්හිද; තෙන ද්ධානමග්ගං; ඒදිශාභාගයෙහිවූ දීර්ඝමාර්ගයට; පටිපජ්ජි, පිළිපන් සේක.

---

* පච්ඡායභත්තං—සමහර

† සංසාමෙත්වා

‡ හත්ථත්ථං

ගොපාලකා, ගවපාලයෝද; පසුපාලකා, පසුපාලයෝද; කස්සකා, සීසෑමෙහි නියුක්තයෝද; පදාවිනො, මගීජනයෝද; යෙනඅඞ්ගුලිමාලොචොරො, අඞ්ගුලිමාලනම් චෞරතෙම යම්දිශාභාගයෙක්හිද; තෙනද්ධානමග්ගං, ඒදිශාභාගයෙහිවූ දීර්ඝමාර්ගයට; පටිපජ්ජනො, පිළිපන්නාවූ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේ; අද්දසාසුංඛො, දුටුවාහුය; දිස්වා, දැක; භගවන්තං, ශතපුණ්‍ය ලක්‍ෂණධරත්වාදි භාග්‍යයෙන් යුක්තවූ සර්වඥයන්වහන්සේට; සමණ, ශ්‍රමණයන්වහන්ස; එතංමග්ගං, මේමාර්ගයට; මාපටිපජ්ජි, පිළිනොපැද්ද මැනව; සමණ, ශ්‍රමණයාණන්වහන්ස; එතස්මිංමග්ගෙ, මේ මාර්ගයෙහි: ලුද්දො, රෞද්‍රවූ; ලොහිතපාණී, ලෙහෙවැකුණු අත් ඇත්තාවූ; හතපහතෙනිවිට්ඨො, සත්වයන් තැළීමෙහි හා මැරීමෙහි නියුක්තව සිටියාවූ; පාණභූතෙසු, සකලප්‍රාණීන්කෙරෙහි; අදයාපන්නො, කාරුණ්‍යවක් නැත්තාවූ; අඞ්ගුලිමාලොනාම චොරොහොති, අඞ්ගුලිමාලනම් චෞරයෙක් වන්නේය.

තෙන, ඔහුවිසින්; ගාමාපි, ග්‍රාමයන්ද; අගාමාකතා, (මනුෂ්‍යයන්ගේ සංචාරය වැළකීමෙන්) අගම්කරණලද්දාහුය; නිගමාපි, නොයෙක් ක්‍ෂෙත්‍ර වස්තු ගවමහිෂාදීන් සම්පූර්ණවූ නියම්ගම්ද; අනිගමාකතා (මනුෂ්‍යයන්ගේ සංචාරය වැළකීමෙන්) අනියම් ගම් කරණලද්දාහුය; ජනපදාපි, (සකලසම්පත්තීන් සම්පූර්ණසමස්ත) ජනපදයෝද; අජනපදාකතා, (මනුෂ්‍යයන්ගේ සංචාරය වැළකීමෙන්) අජනපදකරණලද්දාහුය. සො, ඒඅඞ්ගුලිමාලනම් චෞරතෙම; මනුස්සෙ, මනුෂ්‍යයන්; වධිත්වාවධිත්වා, මරමරා; අඞ්ගුලීනං, අඞ්ගුලීන් සම්බන්ධව; මාලංධාරෙති, මාලාවක් දරන්නේය. සමණ, ශ්‍රමණයාණන්වහන්ස; එතංහිමග්ගං, මේමාර්ගයෙහි වනාහි; දසපිපුරිසා, පුරුෂයෝ දශදෙනෙක්ද; වීසතිම්පිපුරිසා, පුරුෂයෝ විසිදෙනෙක්ද; තිංසම්පිපුරිසා, පුරුෂයෝ තිසෙක්ද; චත්තාලීසම්පිපුරිසා, පුරුෂයෝ සතලිසෙක්ද; සංහරිත්වාසංහරිත්වා, කල්පනාකොටකොට නෙවත් සැකකොටකොට නොහොත් වර්ගවර්ගව; පටිපජ්ජන්ති, ඒමාර්ගයට පිළිපදනාහුය; තෙපිඛො, එසේ මාර්ගයට පිළිපන් සත්වයෝද; අඞ්ගුලිමාලස්ස චොරස්ස, අඞ්ගුලිමාලනම් චෞරයාගේ හත්ථත්ථංගච්ඡන්තීති, හස්තගතබවටගොස් විනාශයට පැමිණෙන්නාහුයයි යන; එතං මේවක්‍ෂ්‍යමාන වචනය; අවොචුං, භාග්‍යවත්වූ සම්‍යක්සම්බුද්ධ සර්වඥයන්වහන්සේට දැන්වූවාහුය; එවංවුත්තෙ, මෙසේ දැන්වූකල්හි; භගවා (චතුපාරිශුද්ධිශීලනමැති සුදුවැලිතලා ඇති පසළොස්චරණ ධර්මනමැති මිණිතොරණපන්ති ඇති චතුර්විධ බ්‍රහ්මවිහරණ නමැති පියුම්විල් සතරක්ඇති සතරසතිපට්ඨාන නමැති මහාප්‍රාකාරඇති කීර්තිනමැති ධ්වජමාලාඇති අභිඥනමැ

ති මහපවුරු සතරක්ඇති චතුර්විධ ආර්‍යමාර්ග ඥානනාමැති මහවහ සල්දොර සතරක්ඇති, සප්තබොධ්‍යඞ්ග නමැති සල්පිල් පන්තිඇති සප්තවිධ ආර්‍යධන නමැති රුවන්ගබඩාඇති සොපධිශෙෂනිර්වාණ ධාතුනමැති ශාන්තිපුරයට පැමිණ සර්ව්‍යඥතාඥානනාමැති හස්තයෙන් දෙශනානමැති ඛඩ්ගයගෙන කෙලෙස් නමැති සතුරන් නසා තෘෂ්ණානමැති බන්ධනයෙන් මුදාගෙන වෛනෙය්‍යජන නමැති මහ සෙනඟ පිරිවර විමුක්තිනමැති සේසත්නන්වා මෛත්‍රීකරුණා නමැති තරුණියන් දෙදෙනකු අග්‍රස්ථානකොට තබාගෙන ශ්‍රාවක නමැති සෙවකයන්ට දහම්නමැති රුවන් බෙදාදී ධ්‍යාන නමැති ජයපාණ පාණයකොට සමාපත්තිනමැති රාජ්‍යසම්පත්තිය වළඳා, වදාළාවූ) භාග්‍යවතුන්වහන්සේ; තුණ්හීභූතො, තුෂ්ණීම්භූතව; අගමාසි, වැඩිසේක.

4 දුතියම්පිඛො ගොපාලකා පසුපාලකා කස්සකා පදවිනො භගවන්තං එතදවොචුං මාසමණ එතංමග්ගං පටිපජ්ජි එතස්මිං සමණ මග්ගෙ චොරොහොති අඞ්ගුලිමාලොනාම ළුද්දො ලොහිතපාණි හතපහතෙනිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු තෙනගාමාපි අගාමාකතා නිගමාපි අනිගමාකතා ජනපදාපි අජනපදාකතා සො මනුස්සෙවධිත්වාවධිත්වාඅඞ්ගුලීනං මාලංධාරෙති එතංහිසමණමග්ගං දසපිපුරිසාවීසතිම්පිපුරිසා තිංසම්පිපුරිසා චත්තාරීසම්පිපුරිසා සංහරිත්වාසංහරිත්වා පටිපජ්ජන්ති තෙපි චොරස්ස අඞ්ගුලිමාලස්ස හත්ථත්ථංගච්ඡන්තීති දුතියම්පිඛො භගවාතුණ්හීභූතො අගමාසි.

4 දුතියම්පිඛො, දෙවෙනිවාරයෙහිද; ගොපාලකා, ගවපාලයෝද; පසුපාලකා, පසුපාලයෝද; කස්සකා, සීසෑමෙහි නියුක්තයෝද; පදවිනො, මගීජනයෝද; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතදවොචුං, මෙසේකීවාහුය; සමණ, ශ්‍රමණයාණන්වහන්ස; එතං මග්ගං, මේමාර්ගයට; මාපටිපජ්ජි, පිළිනොපැද්දමැනව; සමණ, ශ්‍රමණයාණන්වහන්ස; එතස්මිංමග්ගෙ, මේමාර්ගයෙහි; ළුද්දො, රෞද්‍රවූ; ලොහිතපාණි, ලෙහෙවැකුණු අත්ඇත්තාවූ; හතපහතෙනිවිට්ඨො, සත්වයන් තැළීමෙහි හා මැරීමෙහි නියුක්තව සිටියාවූ; පාණභූතෙසු, සකලප්‍රාණීන් කෙරෙහි; අදයාපන්නො, කරුණාවක් නැත්තාවූ; අඞ්ගුලිමාලොනාමචොරොහොති, අඞ්ගුලිමාල නම් චෞරයෙක් වන්නේය; තෙනහි, ඔහුවිසින් වනාහි; ගාමාපි, ග්‍රාමයන්ද; අගාමාකතා (මනුෂ්‍යයන්ගේ සංචාරය වැළකීමෙන්) අගම් කරණලද්දාහුය. නිගමාපි, (සකලවස්තු විපුලවූ) නිගමග්‍රාමයන්ද; අනිගමාකතා, මනුෂ්‍යයන්ගේ සංචාරය වැළකීමෙන් අනියම්ගම කරණලද්දාහුය; ජනපදාපි, (සකලසම්පත්තීන් සම්පූර්ණවූ සමස්ත)

ජනපදයෝද; අජනපදකතා, මනුෂ්‍යයන්ගේ සංචාරය වැලකීමෙන් අජනපද කරණලද්දාහුය. සො, ඒ අඞ්ගුලිමාල නම් චෞරතෙම; මනුස්සෙ, මනුෂ්‍යයන්; වධිත්වාවධිත්වා, මරමරා; අඞ්ගුලීනංච, අඞ්ගුලීන්සම්බන්ධව; මාලංධාරෙති, මාලාවක් දරන්නේය. සමණ, (මහා) ශ්‍රමණයාණන්වහන්ස; එතංහිමග්ගං, මේමාර්ගයෙහි චනාහි; දසපිපුරිසා, පුරුෂයෝ දශදෙනෙක්ද; වීසතිම්පිපුරිසා, පුරුෂයෝ විස්සෙක්ද; තිංසම්පිපුරිසා, පුරුෂයෝ තිසෙක්ද; චත්තාලීසම්පිපුරිසා, පුරුෂයෝ සතලිසෙක්ද; සංහරිත්වාසංහරිත්වා; කල්පනාකොටකොට හෙවත් වර්ග්වර්ගීව නොහොත් සැක කොටකොට; පටිපජ්ජන්ති; පිළිපදනාහුය. තෙපිඛො, එසේ මාර්ගයට පිළිපුන් සත්වයෝද; අඞ්ගුලිමාලස්ස චොරස්ස, අඞ්ගුලිමාලනම් චෞරයාගේ; හත්ථත්ථංගච්ඡන්තීති, හස්තාගතබවටගොස් විනාශයට යන්නාහුයයි යන; එතං, මේවක්ෂ්‍යමාන වචනය; අවොචුං, භාග්‍යවතුන්වහන්සේට දන්වූවාහුය. දුතියම්පිඛො, දෙවෙනි වාරයෙහිදු; භගවා බුදුරජතෙම, තුණ්හීභූතො, තුෂ්ණීම්භූතව අගමාසි, වැඩිසේක.

5 තතියම්පිඛො ගොපාලකා පසුපාලකා කස්සකාපදවිනො භගවන්තං එතදවොචුං මාසමණ එතංමග්ගං පටිපජ්ජි එත්ථසමිං සමණමග්ගෙ චොරොහොති අඞ්ගුලිමාලොනාම එද්දො ලොහිතපාණී හතපහතෙනිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු තෙනගාමාපි අගාමාකතා නිගමාපි අනිගමාකතා ජනපදාපි අජනපදාකතා සො මනුස්සෙ වධිත්වාවධිත්වා අඞ්ගුලීනං මාලංධාරෙති එතංහි සමණ මග්ගං දසපිපුරිසා වීසතිම්පිපුරිසා තිංසම්පිපුරිසා චත්තාරීසම්පි පුරිසා සංහරිත්වාසංහරිත්වා පටිපජ්ජන්ති තෙපි චොරස්ස අඞ්ගුලිමාලස්ස හත්ථත්ථං ගච්ඡන්තීති තතියම්පිඛො භගවා තුණ්හීභූතො අගමාසි.

5 තතියම්පිඛො, තුන්වෙනිවාරයෙහිදු; ගොපාලකා, ගවපාලයෝද; පසුපාලකා, පසුපාලයෝද; කස්සකා, සීසෑමෙහි නියුක්තයෝද; පදවිනො, මගීජනයෝද; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතදවොචුං, මෙසේ දන්වූවාහුය; සමණ (මහා) ශ්‍රමණයාණන්වහන්ස; එතංමග්ගං; මේමාර්ගයට; මාපටිපජ්ජි, පිළිනොපැද්ද මැනව; සමණ, (මහා) ශ්‍රමණයාණන්වහන්ස; එත්ථසමිංමග්ගෙ, මේමාර්ගයෙහි; එද්දො, රෞද්‍රවූ; ලොහිතපාණී, ලේහෙවැකුණු අත්ඇත්තාවූ; හතපහතෙනිවිට්ඨො, සත්වයන් තැළීමෙහි හා මැරීමෙහි නියුක්තව සිටියාවූ; පාණභූතෙසු, සකලප්‍රාණීන්කෙරෙහි; අදයාපන්නා, කරුණාවක් නැත්තාවූ; අඞ්ගුලිමාලො නාම චොරොහොති, අඞ්ගුලිමාලනම් චෞරයෙක් වන්නේය.

තෙන, ඔහුවිසින්; ගාමාපි, ග්‍රාමයන්ද; අගාමාකතා, මනුෂ්‍යය
න්ගේ සංචාරය වැළැක්මෙන්) අගම්කරණලද්දාහුය. නිගමාපි;
(සියලු සම්පත්තියෙන් සමෘද්ධවූ) නිගමග්‍රාමයන්ද; අනිගමාකතා;
(මනුෂ්‍යයන්ගේ සඤ්චාරයවැලකීමෙන්) අනිගම්ගම්කරණලද්දාහුය;
ජනපදාපි, (සකලසම්පත්ති සම්භාර සම්පූර්ණ) ජනපදයෝද; අජන
පදාකතා; (මනුෂ්‍යයන්ගේ සඤ්චාරය වැලකීමෙන්) අජනපදකරණ
ලද්දාහුය. සො, ඒ අඞ්ගුලිමාලනම් චෞරතෙම; මනුස්සෙ, මනුෂ්‍ය
යන්; වධිත්වාවධිත්වා, මරමරා; අඞ්ගුලීනං, අඞ්ගුලීන් සම්බන්ධව;
මාලංධාරෙති, මාලාවක් දරන්නේය. සමණ, (මහා) ශ්‍රමණයාණ
න්වහන්ස; එතංහිමග්ගං මේමාර්ගයෙහි වනාහි; දසපිපුරිසා, පුරු
ෂයෝ දශදෙනෙක්ද; වීසතිම්පිපුරිසා, පුරුෂයෝ විසිදෙනෙක්ද;
තිංසම්පිපුරිසා, පුරුෂයෝ තිසෙක්ද; චත්තාලීසම්පි පුරිසා, පුරුෂ
යෝ සතලිසෙක්ද; සංහරිත්වාසංහරිත්වා, කල්පනාකොටකොට
හෙවත් සැකකොටකොට නොහොත් වර්ගවර්ගව; පටිපජ්ජන්ති, පිළි
පදනාහුය. තෙපිඛො, එසේ ඒ මාර්ගයට පිළිපන් සත්වයෝද; අඞ්ගු
ලිමාලස්ස චොරස්ස, අඞ්ගුලිමාලනම් චෞරයාගේ; හත්ථත්ථංගච්ඡ
න්තීති, හස්තගතබවටගොස් විනාශයට පැමිණෙන්නාහුයයි යනු;
එතං, මේ වක්ෂ්‍යමානවචනය; අවොචුං, භාග්‍යවතුන්වහන්සේට
දැන්වූවාහුය. භගවා, භාග්‍යවත්වූ බුදුරජතෙම; තතියම්පිඛො,
තුන්වනවාරයෙහිද; තුණ්හීභූතො, තූෂ්ණීම්භූතව; අගමාසි, වැඩි
සේක.

6 අද්දසාඛො චොරො අඞ්ගුලිමාලො භගවන්තං දූරතොව ආග
ච්ඡන්තං දිස්වානස්ස එතදහොසි අච්ඡරියංවතභො අබ්භුතංවතභො
ඉමංහිමග්ගං දසපිපුරිසා වීසම්පිපුරිසා තිංසම්පිපුරිසා චත්තාරී
සම්පිපුරිසා පඤ්ඤාසම්පිපුරිසා සංහරිත්වාසංහරිත්වා පටිපජ්ජන්ති
තෙපිමමහත්ථත්ථං ආගච්ඡන්ති අථචපනායං සමණො එකොඅදු
තියොපසය්හමඤ්ඤෙ ආගච්ඡති යන්නූනාහංඉමං සමණං ජීවිතා
වොරොපෙය්‍යන්ති.

අඞ්ගුලිමාලොචොරො, අඞ්ගුලිමාලනම් චෞරතෙම; දූරතොව,
දුරින්ම; ආගච්ඡන්තං, වඩනාවූ; භගවන්තං, ප්‍රමාණාතික්‍රාන්ත ලොක
ධාතුගත අනන්තාපරිමාණ සත්වයන්ට උත්තම ගෞරවස්ථානීයවූ
සර්වඥරාජොත්තමයාණන්වහන්සේ; අද්දසාඛො, දුටුවාහුය. දිස්
වාන, දැක; භො, පින්වත්නි; වත, ඒකාන්තයෙන්; අච්ඡරියං, ආශ්චර
ය්‍යයෙක; භො, පින්වත්නි; වත, ඒකාන්තයෙන්; අබ්භුතං, අද්භුත
යෙක. හෙවත් පෙරනුවූ දෙයෙක; ඉමංමග්ගං, මේමාර්ගයෙහි වනා
හි; දසපිපුරිසා, පුරුෂයෝ දශදෙනෙක්ද; වීසතිම්පිපුරිසා, පුරුෂ

යෝ විසිදෙනෙක්ද; තිංසම්පිපුරිසා, පුරුෂයෝ තිසෙක්ද; චත්තාරීසම්පිපුරිසා, පුරුෂයෝ සතළිසෙක්ද; පඤ්ඤාසම්පිපුරිසා, පුරුෂයෝ පණසෙක්ද; සංහරිත්වාසංහරිත්වා, කල්පනාකොටකොට නොහොත් වගීවගීව හෙවත් සැකකොටකොට පටිපජ්ජන්ති, පිළිපදනාහුය. තෙපි, එසේපිළිපන්සත්වයෝද; මම, මාගේ; හත්ථත්ථං, ආගච්ඡන්ති, හස්තගතබවටඅවුත් විනාශයට යන්නාහුය. අථච පන, එතකුදුවුවත් වනාහි; අයංසමණො, මේශ්‍රමණභවත් ගෞතම තෙම; එකො, හුදකලාවම; අදුතියො, අවිතීයව හෙවත් අසහායව; පසය්හ, මැඩ; ආගච්ඡතීතිමඤ්ඤෙ, එන්නේයයි හඟිමි. (එහෙයින්) අහං, මම; ඉමංසමණං [අනුත්තරායෂ්ට මාර්ගඥානයෙන් සවාසනාසර්වක්ලේශයන් සමණය කළහෙයින්] ශ්‍රමණනම්වූ සර්වඥයන්වහන්සේ; ජීවිතාවොරොපෙය්‍යං, ජීවිතයෙන් තොර කළෙම්වීම්නම්; යන්නූනාහන්ති, ඉතායෙහෙකැයි; තස්ස. ඔහට; එතදහොසි, මෙසේ සිතෙක්වූයේය.

7 අථඛොචොරො අඞ්ගුලිමාලො අසිචම්මංගහෙත්වා ධනුකලාපංසන්නය්හිත්වා භගවන්තං පිට්ඨිතොපිට්ඨිතොඅනුබන්ධි අථඛොභගවා තථාරූපං ඉද්ධාභිසංඛාරං අභිසංඛාසි යථා චොරො අඞ්ගුලිමාලො භගවන්තං පකතියාගච්ඡන්තං සබ්බථාමෙනගච්ඡන්තොනසක්කොතිසම්පාපුණිතුං අථඛො චොරස්ස අඞ්ගුලිමාලස්ස එතදහොසි අච්ඡරියං වතභො අබ්භුතං වතභො අහංහිපුබ්බෙහත්ථිම්පිධාවන්තං අනුපතිත්වා ගණ්හාමි අස්සම්පිධාවන්තං අනුපතිත්වා ගණ්හාමි රථම්පි ධාවන්තං අනුපතිත්වා ගණ්හාමි මිගම්පි ධාවන්තං අනුපතිත්වාගණ්හාමි අථචපන ඉමංසමණං පකතියාගච්ඡන්තං සබ්බථාමෙන ගච්ඡන්තො නසක්කොමි සම්පාපුණිතුන්ති ඨිතො භගවන්තං එතදවොච තිට්ඨසමණ තිට්ඨසමණ ති ඨිතො අහං අඞ්ගුලිමාලත්වංචතිට්ඨාහීති.

අථඛො, මෙසේ සිතා ඉක්බිත්තෙන්; අඞ්ගුලිමාලො චොරො, අඞ්ගුලිමාලනම් චෞරතෙම; අසිචම්මංගහෙත්වා, කඩුපලිහගෙන; ධනුකලාපංසන්නය්හිත්වා, දුන්න හා හියවුරබැඳ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේගේ; පිට්ඨිතොපිට්ඨිතො, පසුපස්සෙහි; අනුබන්ධි, ලුහුබැන්දේය.

අථඛො, ඉක්බිත්තෙන්; පකතියාගච්ඡන්තං, පියවිගමණින් වඩනාවූ; භගවන්තං, භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ; සබ්බථාමෙනගච්ඡන්තො; සියලු ශක්තියෙන් යන්නාවූ අංගුලිමාලනම් චෞරතෙම; සම්පාපුණිතුං; බුදුරජාණන්වහන්සේ කරා එළඹෙන්නට; නසක්කොති; යම්සේ නොහැකිවේද; භගවා, භාග්‍ය

වතුන්වහන්සේ; තථාරූපං, එබඳුවූ; ඉද්ධාභිසංඛාරං, සෘද්ධ්‍යාභිසංස්කාරයක්; අභිසංඛාසි; නිර්මාණකොට වදාළසේක. අථඛො; ඉක්බිත්තෙන්; අඞ්ගුලිමාලස්ස චොරස්ස, අඞ්ගුලිමාලනම් චෞරයාහට; එතදහොසි, මෙබඳුවූ සිතෙක්වූයේය; භො, පින්වත්නි; වත, ඒකාන්තයෙන්; අච්ඡරියං, ආශ්චර්‍ය්‍යයෙක; හෙවත් පෙරනුවූයෙක; අහංහි, මම වනාහි; පුබ්බෙ, පූර්වයෙහි; ධාවන්තං, ධාවනය කරන්නාවූ; හත්ථිම්පි, හස්තියකුදු; අනුපතිත්වා, ලුහුබඳවාගොස්; ගණ්හාමි, ගන්නෙමි. ධාවන්තං, ධාවනය කරන්නාවූ; අස්සම්පි, අශ්වයකුදු; අනුපතිත්වා, ලුහුබඳවාගොස්; ගණ්හාමි, ගන්නෙමි. ධාවන්තං, ධාවනයකරන්නාවූ; රථම්පි, රථයකුදු; අනුපතිත්වා, ලුහුබඳවාගොස්; ගණ්හාමි, ගන්නෙමි; ධාවන්තං, ධාවනයකරන්නාවූ; මිගම්පි, මෘගයකුදු; අනුපතිත්වා, ලුහුබඳවාගොස්; ගණ්හාමි, ගන්නෙමි. අථචපන, එතකුදුවූවත් වනාහි; පකතියාගච්ඡන්තං, පියවිගමණින් වඩනාවූ; ඉමංසමණං, මේ ශ්‍රමණභවත් ගෞතමයාකාරා; සබ්බථාමෙනගච්ඡන්තො, සියලු ශක්තියෙන් යන්නාවූ; අහං, මම; සම්පාපුණිතුං, පැමිණෙන්ට; නසක්කොමි, නොහැකිවන්නෙමියි කියා; ඨිතො, සිටියේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; තිට්ඨසමණතිට්ඨසමණාති, සිටුව ශ්‍රමණය සිටුව ශ්‍රමණයයි යන; එතං අවොචුං, මෙසේ දූන්වූයේය. අඞ්ගුලිමාල, අඞ්ගුලිමාලය; අහං, මම; ඨිතො, සිටියෙමි. ත්වංච, තෝද; තිට්ඨාති, සිටුවයි වදාළසේක.

අථඛො චොරස්ස අඞ්ගුලිමාලස්ස එතදහොසි ඉමෙඛොපනසමණා සක්‍යපුත්තියා සච්චවාදිනො සච්චපටිඤ්ඤා අථචපනායං සමණො ගච්ඡයෙවාහ ඨිතො අහං අඞ්ගුලිමාලත්වංචතිට්ඨාහීති යන්නූනාහං ඉමංසමණං පුච්ඡෙය්‍යන්ති අථඛො අඞ්ගුලිමාලො චොරො භගවන්තං ගාථායඅජ්ඣභාසි.

අථඛො; ඉක්බිත්තෙන්; සක්‍යපුත්තියා, ශාක්‍යරජ්ජුරුවන්ගේ පුත්‍රවූ; ඉමෙඛොපනසමණා, මේශ්‍රමණයෝ වනාහි; සච්චවාදිනො, සැබෑනෙපුල් කියන්නාහ. සච්චපටිඤ්ඤා, සත්‍යප්‍රතිඥ ඇත්තාහ; අථචපන, එතකුදුවූවත් වනාහි; අයංසමණො, මේශ්‍රමණභවත් ගෞතමතෙම; ගච්ඡයෙව, යන්නේම; අඞ්ගුලිමාල, අඞ්ගුලිමාලය; අහං, මම; ඨිතො, සිටියෙමි. ත්වංච, තෝද; තිට්ඨාහීති. සිටුවයි; ආහ, කියන්නෙහිය; (එහෙයින්) අහං, මම; ඉමංසමණං, මේශ්‍රමණයා; පුච්ඡෙය්‍යං, විචාලෙම්විම්නම්; යන්නූනඉති, ඉතා යෙහෙකැයි; අඞ්ගුලිමාලස්ස චොරස්ස, අඞ්ගුලිමාලනම් චෞරයාට; එතංඅහොසි, මෙසේවූ සිතෙක්වූයේය.

අථඛො, ඉක්බිත්තෙන්: අඞ්ගුලිමාලොචොරො, අඞ්ගුලිමාල නම් චෞරතෙම; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; ගාථාය, අක්ෂර පදනියමිත ග්‍රථිතවචනයෙන්; අජ්ඣභාසි, කීයේය.

ගච්ඡංවදෙසි සමණ ඨිතොම්හි මමඤ්චබ්‍රූසිඨිතමට්ඨිතොති
පුච්ඡාමිතංසමණ එතමත්ථං කථංඨිතොත්වං අහමට්ඨිතොම්හි.

සමණ, ශ්‍රමණභවත් ගෞතමයාණන්වහන්ස; ගච්ඡං, යන්නෙන්; ඨිතොඅම්හි, සිටියෙමි. වදෙසි, කියන්නෙහිය; ඨිතං, සිටියාවූ; මමඤ්ච, මමද; අට්ඨිතොති, නොසිටියේයයි; බ්‍රූහි, කියන්නෙහිය; සමණ, (අනුත්තරආර්‍ය්‍යමාර්ග ඥානයෙන් සවාසනා සර්‍වක්ලේශයන් සමණයකළහෙයින් ශ්‍රමණනම්ලද තථාගතයන්වහන්ස; එතං අත්ථං, මේඅර්ථය; තං, නුඹවහන්සේ අතින්; පුච්ඡාමි, විචාරන්නෙමි; ත්වං, නුඹවහන්සේ; කථංඨිතො, කෙසේ සිටිසේක්ද; අහං මම; අට්ඨිතොඅම්හි, කෙසේ නොසිටියෙම්දැයි විචාළේය.

ඨිතො අහං අඞ්ගුලිමාලසබ්බදා සබ්බෙසුපාණෙසුනිධායදණ්ඩං
ත්වංචපාණෙසු අසඤ්ඤතොඅසිතස්මාඨිතොහංතුවමට්ඨිතොසි.

අඞ්ගුලිමාල, අඞ්ගුලිමාලය; සබ්බදා, හැමකල්හි; සබ්බෙසු පාණෙසු, සකල ප්‍රාණීන්කෙරෙහි; නිධාය දණ්ඩං, බහා තබනලද දණ්ඩමුද්ගරාදිය ඇත්තෙමි.(එහෙයින්) අහං, මම; ඨිතො, සිටියෙමි; ත්වංච, තෝද; පාණෙසු, සකල ප්‍රාණීන් කෙරෙහි; අසඤ්ඤතො අසි, කායසංයමයක් නැත්තෙහිය. තස්මා, එහෙයින්; අහං, මම; ඨිතො, (ප්‍රාණඝාතාදීන් විරතව සංසාර සාගරයෙන් එතරවූ හෙයින්) සිටියෙම්නම් වන්නෙමි. ත්වං, තෝ; (ප්‍රාණඝාතාදීන් නොවැළකීහෙයින්) අට්ඨිතොඅසි, නොසිටියේනම් වන්නෙහිය.

චිරස්සං වත මෙමහිතොමහෙසිමහාවනං සමණොයංපච්චුපාදි
සොහං චිරස්සාපිපහාස්සං පාපංසුත්වාන ගාථංතවධම්මයුත්තං.

මහිතො, දිව්‍යමනුෂ්‍යාදීන්ගෙන් පූජාසත්කාර ලත් හෙයින් මහිතවූ; මහෙසි, මහත්වූ ශීලස්කන්ධාදීන් එසනායගවෙසනයකරණ හෙයින් මහර්ෂීවූ; අයංසමණො, මේ (සමස්ත සත්ත්වොත්තමවූමහා) ශ්‍රමණතෙම; චිරස්සං, බොහෝකලකින්; වත, ඒකාන්තයෙන්; මෙ, මට කාරුණ්‍යවෙන්; ඉමංමහාවනං, මේ මහාවනයට; පච්චුපාදි, එළඹියේති. සොඅහං, හේමම; චිරස්සාපි, බොහෝ කලකිනුදු; තව නුඹ වහන්සේගේ; ධම්මයුත්තං, ධර්මයෙන් යුක්තවූ; ගාථංසුත්වාන, ගාථා වක්අසා; පාපං, අකුසල්; පහාස්සං, හැරියෙමි. හෙවත් නිරවශෙෂ කොලෙමි.

**ඉච්චෙවං චොරො අසි ආයුධංච සොබ්භෙ පපාතෙ නරකෙ අන්ධකාරි**
**අවන්දි චොරො සුගතස්ස පාදෙ තත්ථෙව නං පබ්බජ්ජං අයාචි.**

ඉච්චෙවං, මෙසේ; චොරො, අඞ්ගුලිමාලනම් චෞරතෙම; අසි, ඛඩ්ගයද ආයුධංච, පඤ්චායුධයද; සොබ්භෙ, හාත්පසින් බිඳුනාවූ; පපාතෙ, එක්දිසාවකින් වලවූ; නරකෙ, නරාවළෙක්හි; අන්ධකාරී, දුමුයේය. චොරො, අඞ්ගුලිමාල නම් චෞර තෙම; සුගතස්සපාදෙ, ශොභනගමනත්වාදි කාරණයෙන් සුගතනම්වූ සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාදවන්දය; අවන්දි. හස්තපුට මස්තකයෙහි තබා වැන්දේය; තත්ථෙව, එතැන්හිම; නං, ඒ සර්වඥයන්වහන්සේගේ සමීපයෙන්; පබ්බජ්ජංඅයාචි, ප්‍රව්‍රජ්‍යාවට යාච්ඤාකෙළේය.

**බුද්ධොබො කාරුණිකොමහෙසි යොසත්ථාලොකස්ස සදෙවකස්ස,**
**තමෙහි භික්ඛූතිතදා අවොච එසෙවතස්ස අහුභික්ඛුභාවොති.**

සදෙවකස්ස ලොකස්ස, දෙව්මිනිසුන් සහිත සත්වලොකය හට; යොසත්ථා, යමෙක් ශාස්තෘද; කාරුණිකො, කරුණා ඇත්තාවූ; මහෙසි, මහාර්ෂීවූ; යොචඛොබුද්ධො, යම් ඒ සර්වඥ රාජොත්තමයාණන්වහන්සේ, තං, ඒඅංගුලිමාලයාහට; භික්ඛු, මහණ; එහිඉති, මෙසේවරෙවයි; තදා, එකල්හි; අවොච, වදාළසේක; තස්ස, ඔහට එසෙව, ඒවචනයම, භික්ඛුභාවො, එහි භික්ෂුභාවය; අහුඉති, වූසේයි.

**අථඛොභගවා ආයස්මතා අඞ්ගුලිමාලෙන පච්ඡා සමණෙන යෙනසාවත්ථි තෙනචාරිකං පක්කාමි අනුපුබ්බෙන චාරිකං චරමානො යෙනසාවත්ථි තදවසරි තත්‍රසුදං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථ පිණ්ඩිකස්සආරාමෙ.**

අථඛො, ඉක්බිත්තෙන්; භගවා භාග්‍යවත්වූ සර්වඥරාජොත්තමයාණන්වහන්සේ; පච්ඡාසමණෙන, පසුමහණවූ හෙවත් අනු වැසිවූ; ආයස්මතා අඞ්ගුලිමාලෙන, ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිර යන්වහන්සේ ලවා (පාසිවුරු ගෙන්වාගෙන;) යෙනසාවත්ථි, (අමර පුර ශ්‍රීධරසකල නගරාඞ්ග සම්පත්තියෙන් සමෘද්ධවූ) ශ්‍රාවස්ති පුරය යම්තැනෙක්හිද; තෙන, එතැන්හි; චාරිකංපක්කාමි, තමා හුන් තැනින් නික්මතත් තත්ප්‍රදෙශාතික්‍රාන්තකොට වැඩිසේක.

අනුපුබ්බෙන, අනුක්‍රමයෙන්; චාරිකං චරමානො, සැරිසරා වඩ නාසේක්; යෙනසාවත්ථි, සැවැත්නුවර යම්තැනෙක්හිද; තදවසරි, එතැන්හි වැඩිසේක; භගවා, සර්වඥරාජොත්තමයාණන් වහන්සේ; තත්‍රසුදං සාවත්ථියං ඒසැවැත්නුවර සමීපයෙහිවූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬුමහසිටුහුවිසින් කරවා පිළිගන්වනලද ජෙතව

නාරාමයෙහි; විහරති, චතුර්විධ ඊර්‍ය්‍යාපථයෙන් යුක්තව වැඩවාසය කරණසේක.

තෙනඛොපන සමයෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස අන්තෙපුරද්වාරෙ මහාජනකායො සන්නිපතිත්වා උච්චාසද්දො මහාසද්දොහොති චොරොතෙදෙව විජිතෙ අඞ්ගුලිමාලොනාම ලුද්දො ලොහිතපාණී හතපහතෙනිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු තෙනගාමාපි අගාමාකතා නිගමාපි අනිගමාකතා ජනපදාපි අජනපදාකතා සොමනුස්සෙවධිත්වා වධිත්වා අඞ්ගුලීනං මාලංධාරෙති තංදෙවොපටිසෙධෙතූති.

තෙනඛොපන සමයෙන, එසමයෙහි වනාහි; පසෙනදිස්ස කොසලස්සරඤ්ඤො, පසෙනදි කොසොල්මහ රජහුගේ; අන්තෙපුරද්වාරෙ, අන්තඃපුරද්වාරයෙහි; මහාජනකායො, මහාජනසමූහතෙම; සන්නිපතිත්වා රැස්ව; දෙව, දෙවයන්වහන්ස; තෙවිජිතෙ, ඔබවහන්සේගේ ආඥපවත්නාවූ රටෙහි; ලුද්දො, රෞද්‍රවූ, ලොහිතපාණී; ලෙහෙවැකුණු අත් ඇත්තාවූ; හතපහතෙනිවිට්ඨො, සත්වයන් තැළිමෙහි හා මැරීමෙහි නියුක්තව සිටියාවූ; පාණභූතෙසු, සකල ප්‍රාණීන් විෂයෙහි; අදයාපන්නො, කරුණාවක් නැත්තාවූ; අඞ්ගුලිමාලොනාම චොරොහොති, අඞ්ගුලිමාලනම් චෞරයෙක් වන්නේය. තෙන, ඔහු විසින්; ගාමාපි, ග්‍රාමයන්ද; අගාමාකතා, (මනුෂ්‍යයන්ගේ සංචාරය වැලකීමෙන්) අගම් කරණලද්දාහුය; නිගමාපි; (විපිවාසල් දොරටුහා සියදහස් ගණන් ගෘහසමූහයෙන් යුක්තවූ) නිගම ග්‍රාමයන්ද; අනිගමාකතා, මනුෂ්‍යයන්ගේ සඤ්චාරය වැළැක්මෙන් අනියම්ගම් කරණලද්දාහුය; ජනපදාපි, (සකල සම්පත්තීන් සම්පූර්ණවූ සමස්ත) ජනපදයෝද; අජනපදාකතා, (මනුෂ්‍යයන්ගේ සංචාරය වැළකීමෙන්) අජනපද කරණලද්දාහුය. සො, ඒ අඞ්ගුලිමාලනම් චෞරතෙම; මනුස්සෙ, මනුෂ්‍යයන්; වධිත්වා වධිත්වා, මරමරා; අඞ්ගුලීනං, අඞ්ගුලීන් සම්බන්ධව; මාලංධාරෙති, මාලාවක් දරන්නේය. තං, ඒ අංගුලිමාලනම් චෞරයා; දෙවො, දෙවයන්වහන්සේ; පටිසෙධෙතූති, වලක්වන සේක්වයි කියා; උච්චාසද්දො මහාසද්දොහොති, උස්ව ශබ්දය පැවැත්වූහ. හෙවත් උද්ඝොෂනය කළාහුය.

අථඛොරාජා පසෙනදිකොසලො පඤ්චමත්තෙහි අස්සසතෙහි සාවත්ථියානික්ඛමිත්වා දිවාදිවස්ස යෙනාරාමොතෙනපායාසියාවතිකායානස්ස භූමියාතෙන ගන්ත්වා යානාපච්චාරොහිත්වා * පත්තිකොව යෙනභගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නංඛො රාජානං පසෙනදි

* පච්චොරොහිත්වා

කොසලං භගවා එතදවොච කින්නුතෙ මහාරාජ මාගධොසෙනියොබිම්බිසාරො කුපිතො වෙසාලිකාවාලිච්ඡවිඅඤ්ඤෙවා පටිරාජානොති.

අථඛො, ඉක්බිත්තෙන්; පසෙනදි කොසලො රාජා, පසෙනදි කොසොල්මහරජතෙම; පඤ්චමත්තෙහි අස්සසතෙහි, පන්සියක් පමණ අශ්වයන් විසින් උපලක්‍ෂිතව; දිවාදිවස්ස, දෙවෙනිදවල් හෙවත් මධ්‍යාහ්ණ වේලෙහි; සාවත්ථියානික්ඛමිත්වා, (ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදි චතුර්වර්ණප්‍රභෙද කුල සඞශ්‍රයන්ට නිවාසවූ) ශ්‍රාවස්තිපුර ප්‍රවරයෙන්; නික්ම; යෙනාරාමො, ජෙතවනාරාමය යම්තැනෙක්හිද; තෙන පායාසි, එතැන්හි ගියේය.

යානස්සභූමි, යානාවට භූමිය; යාවතිකා, යම්තාක්ද ඒතාක් දක්වා; යානෙනගන්ත්වා, යානාවෙන් ගොස්; යානාපච්චොරොහිත්වා, යානාවෙන් බැස; පත්තිකොව, පයින්ම; යෙනභගවා, භාග්‍යවත්වූ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ යම්තැනෙක්හිද; තෙනුපසංකමි, තමාහුන්තැනින් නික්ම තත්තත් ප්‍රදෙශාතික්‍රාන්ත කොට සමීපයට ගියේය.

උපසංකමිත්වා, එතැන්හි එළඹ; භගවන්තං, භාග්‍යවත්වූ සර්වඥරාජොත්තමයාණන්වහන්සේට; අභිවාදෙත්වා, නමස්කාරකොට; එකමන්තංනිසීදි, එකත්පස්ව හුන්නේය.

එකමන්තංනිසින්නංඛො, එකත්පස්ව හුන්නාවූ; පසෙනදි කොසලංරාජානං, පසෙනදිකොසොල්මහ රජහට; භගවා, භාග්‍යවන්තාදි ගුණයෙන් යුක්තවූ සර්වඥ රාජොත්තමයාණන්වහන්සේ; එතදවොච, මෙසේ වදාළසේක; මහාරාජ, මහරජ; තෙ, තොපට; කින්නු, කිමෙක්ද; සෙනියො, මහත් සේනාවාහනයෙන් යුක්තවූ; මාගධො, මගධෙශ්වරවූ; බිම්බිසාරොකුපිතො, බිම්බිසාර මහරජ තෙම කිපුනේද; වා, නොහොත්; වෙසාලිකා, විශාලා මහනුවර වාසීවූ; ලිච්ඡවිකාකුපිතා, ලිච්ඡවි රජදරුවෝ කිපුනාහුද; වා, නොහොත්; අඤ්ඤෙපටිරාජානොති, අන්සතුරු රජකෙනෙක් හෝ කිපුනාහුදැයි යන, එතංඅවොච, මේවචනය වදාළසේක.

නඛොමෙහන්තෙරාජා මාගධොසෙනියො බිම්බිසාරොකුපිතො නපිවෙසාලිකාලිච්ඡවී නපිඅඤ්ඤෙපටිරාජානො චොරො මෙහන්තෙ විජිතෙ අඞ්ගුලිමාලොනාම ළුද්දො ලොහිතපාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො පාණභූතෙසු තෙනගාමාපි අගාමාකතා නිගමාපි අනිගමාකතා ජනපදාපි අජනපදාකතා සොමනුස්සෙ වධිත්වා වධිත්වා අඞ්ගුලීනං මාලංධාරෙති තමහංභන්තෙ පටිසෙධිස්සාමීති.

භන්තෙ, ස්වාමීන්වහන්ස; මෙ, මට; සෙනියො, මහත් සේනාවාහනයෙන් යුක්තවූ; බිම්බිසාරො, බිම්බිසාර මහරජද; නකුපිතො, නොමකිපියේය; වෙසාලිකා, විශාලාමහනුවර වාසීවූ; ලිච්ඡවී, ලිච්ඡවි රජදරුවෝද; නකුපිතා, නොමකිපියාහුය; අඤ්ඤෙ පටිරාජානො, අන්සතුරු රජකෙනකුද; නකුපිතා, නොමකිපුනාහුය; භන්තෙ, ස්වාමීන්වහන්ස; මෙවිජිතෙ, මාගේ ආඥාප්‍රවෘත්තස්ථානයෙහි හෙවත් කොසොල්ජනපදයෙහි; ළුද්දො, රෞද්‍රවූ; ලොහිතපාණී, ලෙහෙවැකුණු අත් ඇත්තාවූ; හතපහතෙනිවිට්ඨො, සත්වයන් තැළීමෙහි හා මැරීමෙහි නියුක්තව සිටියාවූ; පාණභූතෙසු, සකලප්‍රාණීන් කෙරෙහි; අදයාපන්නො, කරුණාවක් නැත්තාවූ; අඞ්ගුලිමාලොනාම චොරො, අඞ්ගුලිමාලනම් චෞරයෙක් වන්නේය. තෙන, ඔහුවිසින්; ගාමාපි, ග්‍රාමයන්ද; අගාමීකතා, (මනුෂ්‍යයන්ගේ සඤ්චාරය වැළකීමෙන්) අගම්කරණලද්දාහුය. නිගමාපි නිගම ග්‍රාමයන්ද, අනිගමාකතා, (මනුෂ්‍යයන්ගේ සඤ්චාරය වැළකීමෙන්) අනියම්ගම් කරණලද්දාහුය. ජනපදාපි, (සියලු සම්පත්තීයෙන් සම්පූර්ණවූ සමස්ත) ජනපදයෝද; අජනපදාකතා, (මනුෂ්‍යයන්ගේ සඤ්චාරයවැළකීමෙන්) අජනපද කරණලද්දාහුය; සො, ඒ අංගුලිමාලනම් චෞරතෙම; මනුස්සෙ මනුෂ්‍යයන්; වධිත්වා වධිත්වා, මරමරා; අංගුලීනං, අඞ්ගුලීන් සම්බන්ධව; මාලංධාරෙති, මාලාවක් දරන්නේය. භන්තෙ, සමස්ත ලොකොත්තමවූ සර්වඥයන්වහන්ස; අහං, මම; තං, ඒ අඞ්ගුලිමාලයා; පටිසෙධිස්සාමීති, වළක්වන්ට යෙමියි දැන්වූයේය.

සචෙපනත්වං මහාරාජ අඞ්ගුලිමාලං පස්සෙය්‍යාසි කෙසමස්සුංඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතං විරතං පාණාතිපාතා විරතං අදින්නාදානා විරතං මුසාවාදා ඒකභත්තිකං බ්‍රහ්මචාරිං සීලවන්තං කල්‍යාණධම්මං කින්තිනං කරෙය්‍යාසීති අභිවාදෙය්‍යාම වා භන්තෙ පච්චුට්ඨෙය්‍යාම වා ආසනෙනවා නිමන්තෙය්‍යාමවාපි නංචීවර පිණ්ඩපාතසෙනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරෙහි ධම්මිකංවා අස්සරක්ඛාවරණ ගුත්තිං සංවිදහෙය්‍යාමකුතොපනස්ස භන්තෙ දුස්සීලස්ස පාපධම්මස්සඑවරූපොසීලසංයමො භවිස්සතීති.

මහාරාජ, මහරජ: කෙසමස්සුංඔහාරෙත්වා, කෙශමශ්‍රූන්හරවා; කාසායානිවත්ථානි අච්ඡාදෙත්වා, කාෂායවස්ත්‍රයන් හැඳ; අගාරස්මා, ගිහිගෙන් නික්ම; අනගාරියං, සර්වඥසාසනයෙහි; පබ්බජිතං, පැවිදිවූ; පාණාතිපාතාවිරතං, ප්‍රාණතිපාතයෙන් වැළැක්කාවූ; අදින්නා

දානාවිරතං, අදත්තාදානයෙන් වැළැක්කාවූ; මුසාවාදාවිරතං, මෘෂාවාදයෙන් වැළැක්කාවූ; එකභත්තිකං, ඒකභක්තිකවූ; හෙවත් එක්වේලේ අනුභවකරන්නාවූ; බ්‍රහ්මචාරිං, බ්‍රහ්මචාරීවූ; සීලවන්තං, සිල්වත්වූ; කල්‍යාණධම්මං, යහපත් ධර්‍මඇත්තාවූ; අඞ්ගුලිමාලං, අඞ්ගුලිමාලයා; ත්වංපන, තෝවනාහි; සචෙපස්සෙය්‍යාසි, ඉදින් දුටුයේවීනම්; තං, ඒ අඞ්ගුලිමාලයාහට; කින්තිකරෙය්‍යාසීති, කුමක්කරන්නෙහිදැයි විචාරා වදාලසේක.

භන්තෙ, ස්වාමීන්වහන්ස; අභිවාදෙය්‍යාමවා, වැඳීම හෝ කරම්හ; පච්චුට්ඨෙය්‍යාමවා, නැගිසිටීම හෝ කරම්හ; ආසනෙනවා නිමන්තෙය්‍යාම, ආසනයෙන් හෝ පූජාකරම්හ; අපි, නැවත; තං, ඒ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරෙහි, චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය භෛෂජ්‍ය පරිෂ්කාරය යන සිව්පසයෙන්; අභිනිමන්තෙය්‍යාම, නිමන්ත්‍රණය හෝ කරම්හ; තං, ඒ අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේට; ධම්මිකං, ධාර්මිකවූ; රක්ඛාවරණගුත්තිං, රක්ෂාවරණගුප්තියක්ද; සංවිදහෙය්‍යාම, විධානකරම්හ, භන්තෙ, ස්වාමීන්වහන්ස; දුස්සීලස්ස, දුශ්ශීලවූ; පාපධම්මස්ස, පාපස්වභාව ඇත්තාවූ; අස්සපන, ඔහට වනාහි; එවරූපො සීලසංයමො, මෙබඳුවූ ශීලසංයමයෙක්; කුතොභවිස්සතීති, කොයින්වන්නේදැයි විචාළහ.

තෙනඛොපන සමයෙන ආයස්මා අඞ්ගුලිමාලො භගවතො අවිදූරෙ නිසින්නොහොති අථඛො භගවා දක්ඛිණබාහුං පග්ගහෙත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච එසො මහාරාජ අඞ්ගුලිමාලොති අථඛො රඤ්ඤොපසෙනදිස්ස කොසලස්ස අහුදෙවභයං අහුජම්භිතත්තං අහුලොමහංසො අථඛොභගවා රාජානං පසෙනදිං කොසලං භීතං සංවිග්ගං ලොමහට්ඨජාතං විදිත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච මාභායි මහාරාජ මාභායි මහාරාජ නත්ථිතෙ අතොභයන්ති.

තෙනඛොපනසමයෙන, එසමයෙහි වනාහි; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; භගවතො අවිදූරෙ, භාග්‍යවත්වූ සර්‍වඥ රාජොත්තමයාණන් වහන්සේට නුදුරු තැනෙක්හි; නිසින්නොහොති, හුන්නේවේ.

අථඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන්වහන්සේ; දක්ඛිණබාහුං, දක්ෂිණ ශ්‍රීහස්තය; පග්ගහෙත්වා, දිගුකොට; පසෙනදි

කොසලරාජානං, පසෙනදි කොසොල්මහරජහට, මහාරජ, මහරජ; එසො, මෙතෙම; අඞ්ගුලිමාලොති, අඞ්ගුලිමාලයයි; එතදවොච, මෙසේ වදාළසේක,

අථඛො, ඉක්බිත්තෙන්; පසෙනදිස්ස කොසලස්සරඤ්ඤො, පසෙනදිකොසොල්මහරජහට; අහුදෙව භයං, චිත්තොත්‍රාශයෙක් වූයේය; අහුඡම්භිතත්තං, කායචලනයෙක් වූයේය; අහුලොමහංසො, රොමොද්ගම්යෙක්ද වූයේය; හෙවත් රොමයන්ගේ උද්ගමණයෙක්ද වූයේය; අථඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භීතං, භයපත්වූ; සංවිග්ගං, කලකිරුණුවූ; ලොමහට්ඨජාතං, ලොමු දැහැගත්තාවූ; රාජානං පසෙනදිකොසලං, පසෙනදි කොසොල්මහරජහු; විදිත්වා, දැන; පසෙනදි කොසලරාජානං; පසෙනදිකොසොල්මහ රජහට; එතදවොච, මෙසේ වදාළසේක.

මහාරාජ, මහරජ; මාභායි, භයනොගනුව; මහාරාජමාභායි, මහරජ නහමක් භයගනුව; තෙ, තොපට; අතොභයංනත්ථිති, මොහු ගෙන් භයෙක් නැතැයි වදාළසේක.

අථඛො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස අහොසි යංභයං වාඡම්භිතත්තංවා ලොමහංසොවා සොපටිප්පස්සම්භි අථඛොරාජා පසෙනදි කොසලො යෙනායස්මා අංගුලිමාලො තෙනුපසංකමි උපසංකමිත්වා ආයස්මන්තං අංගුලිමාලං එතදවොච අය්‍යොනොභන්තෙ අඞ්ගුලිමාලොති එවංමහාරාජාති කථං ගොත්තොභන්තෙ අය්‍යස්සපිතා කථංගොත්තාමාතාති 'ගග්ගො' ඛොමහාරාජපිතා මන්තානිමාතාති අභිරමතුභන්තෙ අය්‍යොගග්ගොමන්තානිපුත්තො අහමය්‍යස්ස ගග්ගස්සමන්තානිපුත්තස්ස උස්සුක්කං කරිස්සාමි චීවර පිණ්ඩපාත සෙනාසනගිලාන පච්චය භෙසජ්ජපරික්ඛාරන්ති.

අථඛො, ඉක්බිත්තෙන්; පසෙනදිස්ස කොසලස්ස රඤ්ඤො, පසෙනදිකොසොල්මහ රජහට; යංභයංවා, චිත්තොත්‍රාශයෙක් වත්; ඡම්භිතත්තංවා, කායචලනයෙක් හෝ; ලොමහංසොවා, රොමොද්ගම්යෙක්හෝ; අහොසි, වූයේද; සොපටිප්පස්සම්භි, එබඳුවූභයසංහිඳුණේයි; අථඛො, ඉක්බිත්තෙන්; පසෙනදි කොසලරාජා, පසෙනදි කොසොල්මහරජතෙමේ; යෙනායස්මා අංගුලිමාලො, ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද; තෙනුපසංකමි, තම්හුන්තැනින් නික්ම සමීපස්ථානයට එළඹියේය; උපසංකමිත්වා, එතැන්හි එළඹ; ආයස්මන්තං අංගුලිමාලං, ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන්වහන්සේට; භන්තෙ, ස්වාමීන්වහන්ස;

ආයස්මා, (අපගේ) ආයුෂ්මත්වූ; අඞ්ගුලිමාලොති, අඞ්ගුලිමාල ස්ථවිරදැයි යන, එතදවොච, මේ වචනය දැන්වූයේය.

මහාරාජ, මහරජ; එවන්ති, එසේයයි වදාළසේක; භන්තෙ, ස්වාමීන්වහන්ස; අය්‍යස්ස, ආයුෂ්මතුන්වහන්සේගේ; පිතා, පිතෘතෙම; කථංගොත්තො, කවරගෝත්‍රයක් ඇත්තේද; මාතා, මෑණිතොමෝ; කථංගොත්තාති, කවර ගෝත්‍රයක් ඇත්තේදැයි විචාළේය. මහාරාජ, මහරජ; මෙ, මාගේ; පිතා, පිතෘතෙම; ගග්ගොඛො, ගග්ග නම් ගෝත්‍ර ඇත්තේය. මාතා, මෑණිතොමෝ; මන්තානීති, මන්තානි බ්‍රාහ්මණී නම් වන්නීයයි වදාළසේක.

භන්තෙ, ස්වාමීන්වහන්ස; ගග්ගො, ගග්ගගෝත්‍ර ඇත්තාවූ; මන්තානිපුත්තො, මන්තානිබ්‍රාහ්මණියගේපුත්‍රවූ; අය්‍යො, ආයුෂ්මතුන් වහන්සේ; අභිරමතු, ශාසනයෙහි සිත් අලවා වාසයකරණසේක්වා; අහං, මම; ගග්ගස්ස, ගග්ගගෝත්‍රඇත්තාවූ; මන්තානිපුත්තස්ස, මන්තානිබ්‍රාහ්මණියගේ පුත්‍රවූ; අය්‍යස්ස, ආයුෂ්මතුන්වහන්සේට; චීවරපිණ්ඩපාත සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා; චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය භෛසද්‍ය පරිෂ්කාර යන මෙයින්; උස්සුක්කංකරිස්සාමීති, උත්සාහකොට පවත්වමියි කීයේය.

තෙනඛොපනසමයෙන ආයස්මා අඞ්ගුලිමාලො ආරඤ්ඤකො හොති පිණ්ඩපාතිකොපංසුකූලිකොතෙචීවරිකො අථඛො ආයස්මා අඞ්ගුලිමාලො රාජානං පසෙනදිකොසලං එතදවොච අලංමහාරාජපරිපුණ්ණංමෙතිචීවරන්ති අථඛොරාජාපසෙනදි කොසලො යෙනභගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තංනිසීදි එකමන්තංනිසින්නොඛො රාජාපසෙනදි කොසලො භගවන්තං එතදවොච අච්ඡරියම්භන්තෙ අබ්භුතං භන්තෙයාවඤ්චිදං භන්තෙභගවා අදන්තානංදමෙතා අසන්තානං සමෙතා අපරිනිබ්බුතානං පරිනිබ්බාපෙතායංමයංභන්තෙනාසක්ඛිම්හ දණ්ඩෙනපි සත්ථෙනපි දමෙතුංසොභගවතා අදණ්ඩෙන අසත්ථෙනෙව දන්තො හන්දච දානිමයංභන්තෙ ගච්ඡාමබහුකිච්චාමයං බහුකරණීයාති යස්සදානිත්වං මහාරාජ කාලංමඤ්ඤසීති අථඛො රාජාපසෙනදි කොසලො උට්ඨායාසනාභගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණංකත්වාපක්කාමි.

තෙනඛොපන සමයෙන, එසමයෙහි වනාහි; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; ආරඤ්ඤකොහොති, ආරණ්‍යකාඞ්ගය රක්ෂාකරණසේක; පිණ්ඩපාතිකො, පිණ්ඩපාතිකාඞ්ගය රක්ෂාකරණසේක; පංසුකූලිකො, පාංශුකූලිකාඞ්ගය රක්ෂාකරණසේක; තෙචීවරිකො, තෛචීවරිකාඞ්ගය රක්ෂාකරණසේක.

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; රාජානං පසෙනදිංකොසලං, පසෙනදිකොසොල්මහරජහට; එතංඅවොච, මෙසේ වදාළසේක; මහාරාජ, මහරජ; මෙ, මාගේ; තිචීවරං, තුන්සිවුරු; පරිපුණ්ණං, සම්පූර්ණය; අලන්ති, නුඹගේ සිව්පසයෙන් කම්නැතැයි වදාළසේක.

අථඛො, ඉක්බිත්තෙන්; පසෙනදි කොසලරාජා, පසෙනදිකොසොල්මහරජතෙම; යෙනභගවා, භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද; තෙනුපසංකමි, තමාහුන්තැනින් නික්ම තත්තත්ප්‍රදෙශාතික්‍රාන්තකොට සමීපස්ථානයටගියේය; උපසංකමිත්වා, එතැන්හි එළඹ; භගවන්තං, භාග්‍යවත්වූ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේට; අභිවාදෙත්වා, දසනඛසමොධානයෙන් සමන්විතවූ අඤ්ජලිපුටම්ස්තකයෙහි තබා නමස්කාරකොට; එකමන්තංනිසීදි, එකත්පස්වහුන්නේය; එකමන්තංනිසින්නොඛො. එකත්පස්ව හුන්නාමවූ; රාජා පසෙනදිකොසලො, පසෙනදිකොසොල්මහ රජතෙම; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; භන්තෙභගවා, ස්වාමිනි භාග්‍යවතුන්වහන්ස; යාවඤ්චිදං, යම්ප්‍රකාරයකින්; අදන්තානං, දමනය නොකොටහැක්කාවූ සත්වයන්; දමෙතා, (මාර්ගඵලයෙන්) දමනයකොට වදාරණසේක්ද; අසන්තානං, කායවාක් සංයමයක් නැත්තාවූ (සත්වයන්;) සමෙතා, කායවාක් සංයමයෙහි පිහිටුවනසේක්ද; අපරිනිබ්බුතානං, ක්ලේශපරිනිර්වාණය නොකළාවූ සත්වයන්; පරිනිබ්බාපෙතා, ක්ලේශපරිනිර්වාණය කරවනසේක්ද; භන්තෙ, ස්වාමින්වහන්ස; මයං, අපි; යංහි, යමක්හුවනාහි: දණ්ඩෙනපි, දණ්ඩයෙන්ද; සත්ථෙනපි, ශස්ත්‍රයෙන්ද; දමෙතුං, දමනයකරන්ට; නසක්ඛිම්හ, නොහැකිවෙම්ද; සො, ඒ දණ්ඩමුද්ගරාදියෙන් දමනයකොටගත නොහැක්කාවූ පුද්ගලතෙම; භගවතා, භාග්‍යවතුන්වහන්සේ විසින්; අදණ්ඩෙන, කිසි දණ්ඩ මුද්ගරාදියක් නැතිව; අසත්ථෙන, කිසි ශස්ත්‍රයක්නැතිව; දමෙතා, (මාර්ගදමනයෙන්)දමනයකරණලද්දේය. (එහෙයින්) භන්තෙ, ස්වාමින්වහන්ස; අච්ඡරියං, ඉතා ආශ්චර්යයෙක; භන්තෙ, ස්වාමින්වහන්ස; අබ්භුතං, පෙරනුවූයෙක; භන්තෙ, ස්වාමින්වහන්ස; මයං, අපි; බහුකිච්චා, බොහෝ රාජකෘත්‍ය ඇත්තම්හ; බහුකරණීයා, බොහෝකටයුතු ඇත්තම්හ; හන්ද, එබැවින්; ඉදානි, දැන් මයං, අපි; ගච්ඡාමඉති, යම්හයි යන; එතං අවොච, මේවචනය දැන්වූයේය,

මහාරාජ, මහරජ; ත්වං, තෝ; ඉදානි, දැන්; (යම්ගමනකට) කාලංමඤ්ඤසීති, කල්දන්නේවීනම් යවයි වදාළසේක; අථඛො, ඉක්

ඛිත්තෙන්; පසෙනදිකොසලොරාජා, පසෙනදි කොසොල්මහරජ තෙම; උට්ඨායාසනා, හුනස්නෙන් නැඟීසිට; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, දසනඛසමොධානසමුජ්ජලිත අජලිමුදුනෙහි තබාවැඳ; පදක්ඛිණංකත්වා, ප්‍රදක්ෂිණකොට; පක්කාමි, ගියේය.

අථඛො ආයස්මා අඞ්ගුලිමාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩායපාවිසි අද්දසාඛො ආයස්මා අඞ්ගුලිමාලො සාවත්ථියං සපදානං පිණ්ඩායචරමානො අඤ්ඤතරං ඉත්ථිංමූළ්හගබ්භං විසානගබ්භං * දිස්වානස්සඑතදහොසි කිලිස්සන්තිවතභොසත්තා කිලිස්සන්තිවතභොසත්තාති.

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; පුබ්බණ්හසමයං, පූර්වාහ්ණකාලයෙහි; නිවාසෙත්වා, හැඳපෙරව; පත්තචීවරංආදාය, පාසිවුරු ගෙන; සාවත්ථියං ශ්‍රාවස්තිපුරප්‍රවරයට; පිණ්ඩායපාවිසි, පිඬුපිණිස වැඩිසේක.

ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; සාවත්ථියං සැවැත් නුවරෙහි; සපදානං, ගෙපිළිවෙළින්; පිණ්ඩායචරමානො, පිඬුසිඟාවඩනාසේක්: මූළ්හගබ්භං, මූළ්වූ දරුගැබ් ඇති; විසානගබ්භං, ව්‍යසනයට පැමිණියාවූ දරුගැබ් ඇති; අඤ්ඤතරංඉත්ථිං, එක්තරා ස්ත්‍රියක්; අද්දසාඛො, දුටුසේක; දිස්වාන දූක; අස්ස, ඒ අංගුලිමාල ස්ථවිරයන්වහන්සේට; එතදහොසි, මෙසේ වූ සිතෙක්වූයේය; භො, පින්වත්නි; වත ඒකාන්තයෙන්; සත්තා, සත්ත්වයෝ; කිලිස්සන්ති, කිලුටුවූවාහුය; භො, පින්වත්නි; වත, ඒකාන්තයෙන්; සත්තා, සත්ත්වයෝ; ක්ලිස්සන්තීති, කිලුටුවූවාහුයයි යන මෙසේ සිතෙක්වූයේය.

අථඛො ආයස්මා අඞ්ගුලිමාලො සාවත්ථියං පිණ්ඩායචරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙනභගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තංනිසීදි එකමන්තංනිසින්නොඛො ආයස්මා අඞ්ගුලිමාලො භගවන්තං එතදවොච අහම්භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩායපාවිසිං අද්දසංඛො අහංභන්තෙ සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො අඤ්ඤතරං ඉත්ථිං මූළ්හගබ්භං විසානගබ්භං දිස්වානමෙ එතදහොසි කිලිස්සන්ති වතභො සත්තා කිලිස්සන්ති වතභො සත්තාති තෙනහිත්වං අඞ්ගුලිමාල යෙනසාවත්ථි තෙනුපසංකම උපසංකමිත්වා තං ඉත්ථිං එවංවදෙහි.

---

* විඝාතගබ්භං—පොත්

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; සාවත්ථියං, ශ්‍රාවස්තිනම්පුර ප්‍රවරයෙහි; පිණ්ඩායචරිත්වා, පිඬුපිණිස හැසිර; පච්ඡාභත්තං, පස්වරු ඒක්ෂණයෙහි; පිණ්ඩපාතපටික්කන්තො, ආහාරයෙන් වැලකුණු සේක්; යෙනභගවා, භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද; තෙනුපසංකමි, එතැන්හි එළඹිසේක; උපසංකමිත්වා එතැන්හි එළඹ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; අභිවාදෙත්වා, දශ (නඛසමොධානයෙන් සමන්විතවූ අඤ්ජලිපුට මස්තකයෙහිතබා) නමස්කාරකොට; එකමන්තංනිසීදි, එකත්පස්ව හුන්සේය.

එකමන්තංනිසින්නොඛො; එකත්පස්ව හුන්නාවූ; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතදවොච, මේවචනය දැන්වූසේක; භන්තෙ, ස්වාමීන්වහන්ස; අහං මම; පුබ්බණ්හසමයං, පූර්වාහ්ණකාලයෙහි හෙවත් පෙරවරු ඒක්ෂණයෙහි; නිවාසෙත්වා හැඳපෙරව; පත්තචීවරංආදාය, පාසිවුරුගෙන; සාවත්ථිං, සැවැත්නුවරට; පිණ්ඩාය, පිඬුපිණිස; පාවිසිං, ප්‍රවිෂ්ටවූයෙමි.

සාවත්ථියං, සැවැත්නුවරෙහි; සපදානං, ගෙපිළිවෙළින්; පිණ්ඩායචරමානො, පිඬුපිණිස හැසිරෙන්නෙමි; මූළ්හගබ්භං, මූළ්වූ දරුගැබ්ඇති; විසාතගබ්භං, ව්‍යසනයට පැමිණි දරුගැබ්ඇති; අඤ්ඤතරං ඉත්ථිං එක්තරා ස්ත්‍රියක්; අද්දසංඛො, දුටුයෙමි; දිස්වාන, දැක; භො, පින්වත්නි; වත, ඒකාන්තයෙන්; සත්තා; සත්වයෝ; කිලිස්සන්තීති, කිලුටුවූවාහුය;භො පින්වත්නි; වත ඒකාන්තයෙන්; සත්තා, සත්වයෝ; කිලිස්සන්ති, කිලුටුවූවාහුයයි යන; එතදහොසි, මට මෙසේ සිතක්වූයේයයි දැන්වූසේක; තෙනහි, එසේවීනම්; අඞ්ගුලිමාල, අඞ්ගුලිමාලය; ත්වං, තෝ; යෙනසාවත්ථි. සැවැත්නුවර යම් තැනෙක්හිද; තෙනුපසංකම, එතැන්හි එළඹෙව; උපසංකමිත්වා, එළඹ; තංඉත්ථිං, ඒ ස්ත්‍රියට; එවංවදෙහි, මෙසේකියව.

“යතොහංභගිණිඅරියාය ජාතියාජාතොනාභිජානාමි සංචිච්චපාණං ජීවිතාවොරොපෙතාතෙනසච්චෙන සොත්ථිතෙහොතු සොත්ථිගබ්භස්සාති”

භගිණි, බුහුණ; අහං, මම; යතොඅරියායජාතියා, යම් ආර්‍ය්‍යජාතියකපටන් උපන්නෙම්ද;* ජාතො එතැන්පටන්; සංචිච්ච, දැනදැන; පාණං, ප්‍රාණියක්හු; ජීවිතාවොරොපෙතා, ජීවිතයෙන් තොරකළා;

---

* යතො අරියායජාතියා, යම්ආර්‍ය්‍යජාතියක්පටන්; ජාතො උපන්නෙම්ද

නාභිජානාමි, නොදනිමි; තෙනසච්චෙන, ඒ සත්‍යවචනය හෙතු කොටගෙන; තෙ, තිට; සොත්ථිහොතු, සැපයෙක් වේවා, සොත්ථි ගබ්භස්ස, ගර්භයටද සැපයෙක්වේවයි; එවංවදෙහිඉති, මෙසේ කියා වයි වදාලසේක.

සොහිනූනමෙහංතෙ සම්පජාන මුසාවාදො, භවිස්සති මයාහි භන්තෙ බහූසඤ්චිච්චපාණා ජීවිතා වොරොපෙතාති තෙනහිත්වං අඞ්ගුලිමාල යෙනසාවත්ථි තෙනුපසංකම උපසංකමිත්වා තං ඉත්ථිං එවංවදෙහි 'යතොහංභගිණි අරියාය ජාතියා ජාතො නාභිජානාමි සංචිච්චපාණං ජීවිතා වොරොපෙතා තෙන සච්චෙන සොත්ථිතෙ හොතු සොත්ථිගබ්භස්සාති'

භන්තෙ, ස්වාමීන්වහන්ස; මයාහි, මාවිසින් වනාහි; සංචිච්ච, දැනදැන; බහුපාණී බොහෝ ප්‍රාණීහු; ජීවිතා වොරොපෙතා, ජීවිත යෙන් තොරකරණලද්දෝය, භන්තෙ, ස්වාමීන්වහන්ස; නූන, ඒකා න්තයෙන්ම; සොහි, එසේකීම; මෙ, මට සම්පජානමුසාවාදො භවි ස්සතීති, දැනදැන බොරුකීමෙක්වන්නේයයි කීසේක.

තෙනහි, එසේවීනම්; අඞ්ගුලිමාල, අඞ්ගුලිමාලය; ත්වං, තෝ; යෙනසාවත්ථි, සැවැත්නුවර යම්තැනෙක්හිද; තෙනුපසංකම, එතැ න්හි එලඹෙව; උපසංකමිත්වා, එළඹ; භගිණි, බුනුණී; අහං, මම; යතොඅරියාය ජාතියා, යම් ආර්‍ය්‍යජාතියෙක පටන් උපන්නෙම්ද; ජාතො, එතැන්පටන්, සංචිච්ච, දැනදැන; පාණං, ප්‍රාණියක්හු; ජීවි තා වොරොපෙතා, ජීවිතයෙන් තොරකලා; නාභිජානාමි, නොදැ න්නෙමි. තෙනසච්චෙන, ඒ සත්‍යවචනය හේතුකොටගෙන; තෙ, තිට; සොත්ථිහොතු, සැපයෙක්වේවා; සොත්ථිගබ්භස්ස, ගර්භයටද සැපයෙක්වේවයි; තංඉත්ථිං, ඒස්ත්‍රියට; එවංවදෙහිඉති, මෙසේ කිය වයි වදාලසේක.

එවංභන්තෙතිඛො ආයස්මා අඞ්ගුලිමාලොභගවතො පටිස්සුත්වා යෙන සාවත්ථි තෙනුපසංකමි උපසංකමිත්වා තංඉත්ථිං එතදවොච.

එවංභන්තෙතිඛො, එසේද පින්වතුන්වහන්සැයි කියා; ආයස් මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; භගවතො පටිස්සුත්වා, භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රතිවචනය ගෙන; යෙනසාවත්ථි, සැවැත්නුවර යම්දිශාභාගයෙක්හිද; තෙනු පසංකමි; එතැන්හි එළඹිසේක; උපසංකමිත්වා, එළඹසිට; තං ඉත්ථිං, ඒස්ත්‍රියට; එතදවොච, මෙසේ වදාලසේක.

"යතොහංභගිණි අරියාය ජාතියා ජාතොනාභිජානාමි සංචිච්ච පාණං ජීවිතාවොරොපෙතා තෙනසච්චෙන සොත්ථිතෙහොතු සොත්ථි ගබ්භස්සාති"

භගිණි, බුහුණ; අහං, මම; යතොඅරියායජාතියා, යම්ආර්‍ය්‍ය ජාතියකපටන් උපන්නෙම්ද; ජාතො, එතැන්පටන්; සංචිච්ච, දැනදැන; පාණං, ප්‍රාණියක්හු; ජීවිතාවොරොපෙතා, ජීවිතයෙන් තොරකළා; නාභිජානාමි, නොදන්නෙමි; තෙනසච්චෙන, ඒ සත්‍ය වචනය හෙතුකොටගෙන; තෙ, තිට; සොත්ථිහොතු, සැපයෙක්වේවයි; සොත්ථිගබ්භස්සාති, ගර්භයටද සැපයෙක් වේවයි වදාළසේක.

අථඛො සොත්ථිත්ථියා අහොසි සොත්ථිගබ්භස්ස.

අථඛො, ඉක්බිත්තෙන්; ඉත්ථියා, ස්ත්‍රියට; සොත්ථි අහොසි, සැපයෙක්වූයේය; ගබ්භස්ස, ගර්භයටද; සොත්ථිඅහොසි, සැපයෙක් වූයේය.

අථඛො ආයස්මා අඞ්ගුලිමාලො එකොවූපකට්ඨො අප්පමත්තො ආතාපීපහිතත්තො විහරන්තො නචිරස්සෙවයස්සත්ථාය කුලපුත්තා සම්මදෙවඅගාරස්මා අනගාරියං පබ්බජන්තිතදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානංදිට්ඨෙවධම්මෙ සයංඅභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජවිහාසි ඛීණාජාතිවුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි අඤ්ඤතරොඛොපනායස්මා අඞ්ගුලිමාලො අරහතංඅහොසි.

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාලස්ථවිරයන්වහන්සේ; එකො අද්විතීයවහෙවත් කායවිවෙකයට පැමිණ; වූපකට්ඨො, වස්තුකාම ක්ලෙශ කාමයන් කෙරෙන් වෙන්ව හෙවත් චිත්තවිවෙකයට පැමිණ; අප්පමත්තො, කර්මස්ථාන භාවනාවෙහි නොහැරණලද සිහිඇතිව; ආතාපී, කෙලෙසුන් තවන වීර්‍ය්‍යඇතිව; පහිතත්තො, නිවන්කරා පැමිණෙනලද සිත් ඇතිව; විහරන්තො, වාසයකරණසේක්; නචිරස්සෙව, නොබෝකලකින්ම; කුලපුත්තා, (ආචාර) කුලපුත්‍රයෝ; යස්සත්ථාය, යම් අර්හත්ඵලයක් පිණිස; සම්මදෙව, මනාකොට; අගාරස්මා, ගිහිගෙන් නික්ම; අනගාරියං සර්වඥශාසනයෙහි; පබ්බජන්ති, පැවදිවෙද්ද; තදනුත්තරං, ඒ අර්හත්ඵලය උතුම්කොටඇති; බ්‍රහ්මචරියං; ශාසනමාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවගේ; පරියොසානං, කෙළවරකොටඇති අර්හත්ඵලයට; දිට්ඨෙවධම්මෙ, ඉහාත්මභාවයෙහිම; සයංඅභිඤ්ඤාය, තමන්විසින් විශිෂ්ටඥානයෙන්දැන; සච්ඡිකත්වා, ප්‍රත්‍යක්ෂකොට; උපසම්පජ්ජ, පැමිණ; විහාසි වාසයකරණසේක.

ජාති, ජාතිතොමො; ඛීණ, මාවිසින් ක්ෂයකරණලද්දීය; බ්‍රහ්මචරියං, මාර්ගබ්‍රහ්මචය්‍යාව; වුසිතං, වැසනිමවනලද්දේය; කරණීයං, කටයුතු කෘත්‍යය; කතං, මාවිසින් කරණලද්දේය; ඉත්ථත්තාය, මේ අර්හත්ඵලයපිණිස; අපරං, මත්තෙහි කටයුතු අන් කිසි කෘත්‍යයක්; නාත්ථි, නැත්තේයයි කියා; අබ්භඤ්ඤාසි, දැනගත්සේක; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; අරහතං, රහතුන් අතුරෙන්; අඤ්ඤතරොඛොපනඅහොසි, එක්තර රහත්කෙනකුන් වහන්සේ වූසේක.

අථඛො ආයස්මා අඞ්ගුලිමාලොපුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩායපාවිසි තෙනඛොපනසමයෙන අඤ්ඤෙනපිලෙඩ්ඩුඛිත්තො ආයස්මතො අඞ්ගුලිමාලස්ස කායෙනිපතති අඤ්ඤෙනපිදණ්ඩොඛිත්තො ආයස්මතො අඞ්ගුලිමාලස්ස කායෙනිපතති අඤ්ඤෙනපිසක්ඛරාඛිත්තො ආයස්මතොඅඞ්ගුලිමාලස්සකායෙනිපතති අථඛො ආයස්මා අඞ්ගුලිමාලො භින්නෙන සීසෙන ලොහිතෙන ගලන්තෙන භින්නෙන පත්තෙන විප්ඵාලිතායසංඝාටියායෙනභගවා තෙනුපසංකමි අද්දසාඛො භගවා ආයස්මන්තං අංගුලිමාලං දූරතොව ආගච්ඡන්තං දිස්වා ආයස්මන්තං අඞ්ගුලිමාලං එතදවොච අධිවාසෙහිත්වං බ්‍රාහ්මණ අධිවාසෙහිත්වං බ්‍රාහ්මණ යස්සඛොත්වං කම්මස්සවිපාකෙන බහූනිවස්සානි බහූනිවස්සසතානි බහූනිවස්සසතසහස්සානි නිරයෙ පච්චෙය්‍යාසිතස්සත්වං බ්‍රාහ්මණකම්මස්සවිපාකං දිට්ඨෙවධම්මෙපටිසංවෙදෙසි අථඛො ආයස්මා අඞ්ගුලිමාලො රහොගතොපටිසල්ලීනො විමුත්ති සුඛපටිසංවෙදී තායං වෙලායං ඉමංඋදානංඋදානෙසි.

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා අංගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාලස්ථවිරයන්වහන්සේ; පුබ්බණ්හසමයං, පූර්වාහ්ණකාලයෙහි; නිවාසෙත්වා, හැඳපෙරව; පත්තචීවරංආදාය, පාසිවුරුගෙන; සාවත්ථිං, ශ්‍රාවස්තිනම් පුරප්‍රවරයට; පිණ්ඩාය, පිඬුපිණිස; පාවිසි, ප්‍රවිෂ්ටවූසේක.

තෙනඛොපනසමයෙන, එසමයෙහි වනාහි; අඤ්ඤෙනපි, (කාකසුනඛාදීන් ලුහුබඳවනු පිණිස) අන්දිසාවකට; ඛිත්තො, දමනලද්දාවූ; ලෙඩ්ඩු, කැටයෙක්; ආයස්මතො අඞ්ගුලිමාලස්ස, ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන්වහන්සේගේ; කායෙ, ශරීරයෙහි; නිපතති, හෙන්නේය; අඤ්ඤෙනපි, අන්දිසාවකට; ඛිත්තො, දමනලද්දාවූ; දණ්ඩො, දණ්ඩමුද්ගරාදිය; ආයස්මතො අඞ්ගුලිමාලස්ස, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේගේ; කායෙ, ශරීරයෙහි; නිපතති, හෙන්නේය.

අඤ්ඤෙනපි, අඤ්ඤදිසාභාගයකට; ඛිත්තො, දමනලද්දාවූ; සක්ඛරා කැටකැබිලිති; ආයස්මතො, අඞ්ගුලිමාලස්ස, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේගේ; කායෙ, ශරීරයෙහි; නිපතති හෙන්නේය.

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මා අඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාලස්ථවිරයන්වහන්සේ; භින්නෙනසීසෙන, බිඳුනාවූ ශීර්ෂයෙන් යුක්තව; ගලන්තෙන, වහනයවන්නාවූ; ලොහිතෙන, ලෙහෙයෙන් යුක්තව; භින්නෙනපත්තෙන, බිඳුනාවූ පාත්‍රයෙන් උපලක්ෂිතව; විප්ඵාරිතායසංඝාටියා, විසුරුනාවූ සඟලසිවුරෙන් උපලක්ෂිතව; යෙනභගවා, භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද; තෙනුපසංකමි, එතැන්හි එළඹිසේක.

භගවා, භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ; දූරතොව ආගච්ඡන්තං, දුරින්ම එන්නාවූ; ආයස්මන්තං අඞ්ගුලිමාලං, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේ; අද්දසාඛො, දුටුසේක, දිස්වාන, දැක; ආයස්මන්තංඅඞ්ගුලිමාලං, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිරයන්වහන්සේට; බ්‍රාහ්මණ, බාහිතපාපීවූ අංගුලිමාලස්ථවිරයෙනි; ත්වං, තෝ; අධිවාසෙසි, ඉවසව; බ්‍රාහ්මණ, බාහිතපාපීවූ බ්‍රාහ්මණය; ත්වං තෝ; අධිවාසෙසි, ඉවසව; යස්සඛොකම්මස්ස, යම් අකුශලකර්මයක්හුගේ; විපාකෙන, විපාකයෙන්; බහූනිවස්සානි, බොහෝවූ අවුරුදු; බහූනිවස්සසතානි, බොහෝ සියගණන් අවුරුදු; බහූනිවස්ස සතසහස්සානි, බොහෝසියදහස්ගණන් අවුරුදු; නිරයෙ, නරකයෙහි; පච්චෙය්‍යාසි, පැසෙන්නෙහිය.

බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; ත්වං, තෝ; තස්සකම්මස්ස, ඒ අකුශල කර්මයාගේ; විපාකං, විපාකය; දිට්ඨෙවධම්මෙ, ඉහාත්මභාවයෙහි; පටිසංවෙදෙසි, ලද්දෙහියයියන; එතංඅවොච, මේවචනය වදාළසේක.

අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මාඅඞ්ගුලිමාලො, ආයුෂ්මත්වූ අඞ්ගුලිමාලස්ථවිරයන්වහන්සේ; රහොගතො, රහසිගතව හෙවත් ගණසඞ්ගනිකායෙන්වෙන්ව; පටිසල්ලීනො, චිත්තෙකාග්‍රතාවට පැමිණිසේක්; විමුත්තිසුඛපටිසංවෙදී, අර්හත්ඵලයට පැමිණ; තායං වෙලායං, එවේලෙහිම; ඉමංඋදානං උදානෙසි, මේප්‍රීතිවාක්‍යය පැවැත්වූසේක.

යොචපුබ්බෙපමජ්ජිත්වා පච්ඡාසොනප්පමජ්ජති
සොඉමංලොකංපභාසෙතිඅබ්භාමුත්තොවචන්දිමා.

සොච, යමෙක්; පුබ්බෙ, පූර්වයෙහි; පමජ්ජිත්වා (කුශලකරණයෙහි) ප්‍රමාදව (වාසයකෙළේද;) සො, ඒ පුද්ගලතෙමේ; පච්ඡා,

පසුව; නප්පමජ්ජති, ප්‍රමාද නොවන්නේවිනම්; * සො, ඒ පුද්ගලතෙම; ඉමංලොකං, මේලොකයෙහි; පභාසෙති, බබලන්නෙහිය; (කෙසේ කුමක්මෙන්ද) අබ්භාමුත්තො; පඤ්චොපක්ලේශයන්ගෙන් විනිර්මුක්තවූ; චන්දිමාඉව, චන්ද්‍රයාමෙනි.

යස්සපාපං කතං කම්මං කුසලෙන පිථීයති,
සො ඉමංලොකං පභාසෙති අබ්භාමුත්තොවචන්දිමා.

යස්ස, යමක්පුවිසින්; කතං, කරණලද්දාවූ; පාපං කම්මං, අකුශල කර්මය; කුසලෙනපිථීයති, (මාගීඵල) කුශලයෙන් සන්හීදෙන්නේද; සො, ඒ පුද්ගලතෙම; ඉමංලොකං, මේ ලොකයෙහි; අබ්භාමුත්තො, පඤ්චොපක්ලේශයන්ගෙන් විනිර්මුක්තවූ; චන්දිමාඉව, චන්ද්‍රයාමෙන්; පභාසෙති, බබලන්නෙහිය.

යොහවෙදහරොභික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,
සො ඉමංලොකං පභාසෙති අබ්භාමුත්තොවචන්දිමා

යොදහරොභික්ඛු, යම් ළදරු මහණෙක් තෙම; බුද්ධ සාසනෙ, සර්වඥශාසනයෙහි; හවෙයුඤ්ජති, ඒකාන්තයෙන් යෙදී වාසයකෙළේවිනම්; සො, ඒ පුද්ගලතෙම; ඉමංලොකං, මේලොකයෙහි; අබ්භාමුත්තො, පඤ්චොපක්ලේශයන්ගෙන් විනිර්මුක්තවූ; චන්දිමාඉව, චන්ද්‍රයාමෙන්; පභාසෙති, බබලන්නෙහිය.

දිසාහිමෙධම්මකථං සුණන්තු දිසාහිමෙයුඤ්ජන්තු බුද්ධසාසනෙ,
දිසාහිමෙතෙමනුජෙ භජන්තු යෙධම්මමෙවාදපයන්තිසන්තො.

දිසාහිමෙ, මාගේ සතුරෝ වනාහි; ධම්මකථංසුණන්තු, ධර්මයෙන් යුක්තවූ කථාවඅසත්වා; මෙ, මාගේ; දිසාහි, සතුරෝ වනාහි; බුද්ධසාසනෙ, සර්වඥ ශාසනයෙහි; යුඤ්ජන්තු, යෙදී වාසයකෙරෙත්වා; මෙ, මාගේ; දිසාහි, සතුරෝ වනාහි; යෙසන්තො, යම් සත්වයෝ තුමූ; ධම්මංඑව, ධර්මයම; ආදපයන්ති, ග්‍රහණයකෙරෙද්ද හෙවත් හදාරද්ද; තෙමනුජෙ, එබඳු සත්වයන්; භජන්තු, භජනය කෙරෙත්වා.

දිසාහිමෙඛන්තිවාදානං අවිරොධප්පසංසිනං,
සුණන්තුධම්මං කාලෙන තඤ්ච අනුවිධීයන්තු.

දිසාහිමෙ, මාගේ සතුරෝවනාහි; ඛන්තිවාදානං, ක්ෂාන්ති වාදය දෙන්නාවූ; අවිරොධප්පසංසිනං, මෛත්‍රියට ප්‍රශංසා කරන්නාවූ සත්වයන්ගේ; ධම්මං, ධර්මයෙන් යුක්ත කථාව; කාලෙන, යුක්තප්‍රාප්තකාලයෙහි; සුණන්තු, අසත්වා; තඤ්ච, ඒධර්මයට; අනුවිධීයන්තු, අනුව පවතිත්වා.

නහිජාතුසොමමංහිංසෙ අඤ්ඤංවාපන කඤ්චිනං,
පප්පුය්‍යපරමංසන්තිං රක්ඛෙය්‍ය තසථාවරෙ

---

* ප්‍රමාදනොවේද.

තතො, එකාන්තයෙන්; සො, ඒමාගේ සතුරුතෙම; නහිම්මංහිංසෙ, මට නහමක් හිංසාකරන්නේමැවා; අඤ්ඤංවාපනකඤ්චිනං, අන්කිසි සත්වයෙක්හටද; (හිංසානොකෙරේවා;) පරමංසන්තිං, උතුම් වූ නිර්වාණයට; පප්පුය්‍ය, පැමිණ; තසථාවරෙ, කෙලෙස්සහිත සත්වයන් හා නිකෙලෙශී සත්වයන්; රක්ඛෙය්‍ය, රක්‍ෂාකෙරේවා.

උදකංහිනයන්තිනෙත්තිකාඋසුකාරානමයන්තිතෙජනං,
දාරුංනමයන්තිතච්ඡකා අත්තානංදමයන්තිපණ්ඩිතා.

නෙත්තිකා, දියඇළිවෝ; උදකංහි, ජලය; නයන්ති, ගෙනයන්නාහුය; උසුකාරා, ඊවඩුවෝ; තෙජනං, ඊදඬු; නමයන්ති, නමා ඇද හරණ්නාහුය; තච්ඡකා, දඬුවඩුවෝ; දාරුං, දඬු; නමයන්ති, සස්නාහුය; පණ්ඩිතා, නුවනැත්තාහු; අත්තානං, තමා; දමයන්ති, දමනය කරන්නාහුයි.

දණ්ඩෙනෙකෙදමයන්ති අඞ්කුසෙහිකසාහිච,
අදණ්ඩෙන අසත්ථෙන අහංදන්තොම්හිතාදිනා.

එකෙ, සමහරකෙනෙක්; දණ්ඩෙන, දණ්ඩයෙන්ද; අඞ්කුසෙහි, අඞ්කුශයෙන්ද; කසාහිච, කටුසැමිටියෙන්ද; දමයන්ති, දමනය කරන්නාහු; තාදිනා, කරුණායෙන් යුක්තවූ; සර්වඥයන්වහන්සේ විසින්; අදණ්ඩෙන, කිසි දණ්ඩමුද්ගරාදියක් නැතිව; අසත්ථෙන, කිසි ශස්ත්‍රයක් නැතිව; අහං, මම; දන්තොඅම්හි, දමනයකරණලද්දෙම් විමි.

අහිංසකොති මෙනාමං හිංසකස්ස පුරෙ සතො,
අජ්ජාහංසච්චනාමොම්හිනහිංහිංසාමි කඤ්චිනං.

පුරෙ, පූර්වයෙහි; හිංසකස්සසතො, සත්වයන්ට හිංසාකලහෙයින්; * අහිංසකොති, අහිංසකයයි; මෙ, මට; නාමං, නමක් වූයේය; අහංඅජ්ජ, මම ශාසනස්ථවූ තැන්පටන්; සච්චනාමොඅම්හි, (චතුස්සත්‍යය අවබොධකලහෙයින්) සච්චය යන නමක් ඇත්තෙමි; (එහෙයින්) කඤ්චිනං, කිසිවක්හටත්; නහිංහිංසාමි, හිංසාවක් නොකරන්නෙමි.

චොරෙ අහංපුරෙ ආසිං අඞ්ගුලිමාලොති විස්සුතො,
වුය්හමානොමහොඝෙන බුද්ධංසරණ මාගමං.

පුරෙ, පූර්වයෙහි; අහං, මම; අඞ්ගුලිමාලොති, අඞ්ගුලිමාලයයි; විස්සුතො, ප්‍රසිද්ධවූ; චොරොආසිං, චෞරයෙක්වූයෙමි; මහොඝෙන,

---

* හිංසකස්සසතො, හිංසාකලාවූ; මෙ, මට;

කාමෝඝාදී සිවුවතුරෙන්: වුය්හමානො, ගෙනයනුලබන්නේ; බුද්ධං සරණං, බුදුන් සරණයට, ආගමිං, ආයෙමි හෙවත් පැමිණියෙමි.

ලොහිතපාණී පුරෙ ආසිං අඞ්ගුලිමාලොති විස්සුතො,
සරණගමනං පස්ස භවනෙත්තිසමූහතා.

පුරෙ, පූර්වයෙහි, අඞ්ගුලිමාලොති, අඞ්ගුලිමාලයයි; විස්සුතො, ප්‍රසිද්ධවූ; ලොහිතපාණී ආසිං, (මම) ලේවැකුණු අත් ඇතිවූයෙමි; භවනෙත්තිසමූහතා, භවනෙත්තියයි කියනලද භවතෘෂ්ණාව නැසුවාවූ සර්වඥයන්වහන්සේගේ; සරණගමණං, සරණගමන; පස්ස, බලව;

තාදිසං කම්මං කත්වාන බහුදුග්ගති ගාමිනං,
ඵුට්ඨො කම්මවිපාකෙන අණණො භුඤ්ජාමි භොජනං

බහුදුග්ගතිගාමිනං, බොහෝ දුර්ගතිගාමිවූ; තාදිසං කම්මං කත්වාන, එබඳු අකුසල් කොට; කම්මවිපාකෙන, මාර්ගඵල කුශල විපාකයෙන්; ඵුට්ඨො, පුළුවුත්නාලදුව නොහොත් පහලකරණ ලදුව; අණණො, නිණයව; භොජනං, (ස්වාමි) භොජනය; භුඤ්ජාමි, අනුභව කෙළෙමි.

පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨංව රක්ඛති.

දුම්මෙධිනො, අඥනවූ; බාලා ජනා, අඥන ජනයෝ; පමාදං කුශලකරණයෙහි ප්‍රමාදභාවයට; අනුයුඤ්ජන්ති, යෙදී වාසයකරන්නාහුය; මෙධාවී, නුවනැත්තාවූ සත්වතෙම; අප්පමාදඤ්ච, කුශලකරණයෙහි අප්‍රමාද භාවයට යෙදී හෙවත් ප්‍රමාදනොවී; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨවූ; ධනං ඉව, ධනයක්මෙන්; රක්ඛති, රක්‍ෂාකරන්නේයි.

[illegible] පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,
[illegible] මත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං.

කාමරතිසන්ථවං, කාමරතිසන්ථවයට; මා අනුයුඤ්ජෙථ, නොයෙදෙවු; පමාදං, ප්‍රමාදයටද; මා, නොයෙදෙවු; හි, එසේමැයි; අප්පමත්තො, අප්‍රමාදව; ඣායන්තො; කල්පනා කරන්නේ; විපුලං සුඛං, මහත්වූ සැපයට; පප්පොති, පැමිණෙන්නේයි.

සාගතං නාපගතං නයිදං දුම්මන්තිතං මම
පවිභත්තෙසු ධම්මෙසු යං සෙට්ඨං තදුපාගමිං.

මම, මාගේ; යංඉදං, යම් මේ ශාසනාසර්වීමෙක් ඇද්ද; තං, එබඳු නිර්වාණසර්වීම; නදුම්මන්තිං, ලාමක නොවන්නේය; පවිභත්තෙසු ධම්මෙසු, එසේ පහලවූ ධර්මයෙහි; යං සෙට්ඨං, යමක් ශ්‍රෙෂ්ඨද; තං, එබඳු නිර්වාණයට; උපාගමිං, පැමිණියෙමි; (එහෙයින්) නාපගතා (මාගේඊම) නපුරුවූ ඊමෙක් නොවන්නේය; සාගතං, යහපත්වූ ඊමෙක.

සාගතං නාපගතං නයිදං දුම්මන්තිතං මම
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

මම, මාගේ; යංඉදං, යම්මේ වචනයෙක් ඇද්ද; තං, ඒවචනය නදුම්මන්ති, ලාමක නොවන්නේය. තිස්සොවිජ්ජා, ත්‍රිවිද්‍යාවටද අනුප්පත්තා, පැමිණියෙමි; බුද්ධස්සසාසනං, සර්වඥයන්වහන්සේගේ අවවාදනුශාසනාව; කතං, මා විසින් සිද්ධකරණලද්දේය; (එහෙයින්ම) නාපගතං, (මාගේ) ඊම නපුරුවූ ඊමෙක් නොවන්නේය; සාගතන්ති, යහපත්වූ ඊමෙක් වන්නේයයි වදාලසේක.

අඞ්ගුලිමාලසූත්‍ර පදාර්ථ

නිමි.

---

මෙම සන්න කතෘතත්කාලදෙශ ව්‍යවහාරයෙන් ලියා තිබෙන මේකාලයෙහි බහුල ව්‍යවහාරයට නොපැමිණි සමහර [illegible]න සිංහල නිරුක්තියට එකඟනොවනසේ හැඟෙනනමුත් අප [illegible]ර් වෙනස් නොකරණලදී.

# ශුද්ධිපත්‍ර

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 3 | 3 | පදුවිම | පදුවිමං |
| 4 | 25 | වීසතිම්පි | වීසතිම්පි |
| 5 | 25 | එත | එතං |
| 6 | 3 | වයිනා | වයිතා |
| 6 | 3 | අඞ්ගුලීනංව | අඞ්ගුලීනං |
| 8 | 8 | අවිතියව | අවිතීයව |
| 3 | 33 | සර්‍වඥයන්වහන්සේ | සර්‍වඥයන්වහන්සේ කරා |
| 8 | 34 | අඞ්ගුලිමාලනම් චොරතෙම් | අඞ්ගුලිමාලො චොරෝ අඞ්ගුලිමාල නම් චෞරතෙමේ; |
| 8 | 35 | බුදුරජානන්වහන්සේ කරා එළඹෙන්නට | එළඹෙන්නට |
| 10 | 15 | ත්වම්ඨීතොසි | තුවම්ඨීතොසි |
| 10 | 22 | ත්වං | තුවං |
| 16 | 9 | ඨිතං | ඨීතං |
| 16 | 14 | අනොහසංත්පිති | අනොහසංතප්පිති |
| 17 | 24 | සාවඡිදු | සාවඡිදං |
| 18 | 16 | නොකෙටහැක්කාවු | නොකොටහැක්කාවූ |
| 20 | 17 | සාවත්ථීසං | සාවත්ථියං |
| 20 | 28 | නාභියානාමි | නාභිජානාමි |
| 21 | 12 | ප්‍රාණිහු | ප්‍රාණීහු |
| 23 | 13 | සඞ්ඛ ාරා | සඞ්ඛාරා |
| 23 | 3 | ආයසමතෙ | ආයස්මතො |
| 23 | 18 | බ්‍රහ්මණ | බ්‍රාහ්මණ |
| 23 | 20 | පඩෙවයාසි | පබ්බජ්‍යාසි |
| 23 | 20 | තාසමත්වා | තාසත්වං |
| 25 | 23 | යුජන්තු | යුජ්ජන්තු |
| 27 | 11 | කමමංකත්වං | කම්මකත්වා |
| 27 | 34 | නාපගතා | නාපගතං |

**උත්පත්තිකථාවේ.**

| | | | |
|---|---|---|---|
| 2 | 30 | පරිකෂා | පරීකෂා |
| 3 | 16 | අපත්වන | අපවත්වන |
| 3 | 20 | භයසන්ත්‍රාන | භයසන්ත්‍රාණ |
| 4 | 7 | ජිවිතය | ජීවිතයට |


# දැන්වීමයි.

මෙම පොත් කොළඹ දිනකරප්‍රකාශ කන්තෝරුවෙන් සහ කච්චේරිය ඉදිරිපිට නොම්මර 30 දරණ ජේ. ඩී. ප්‍රණාන්දුගේ, පොත් සාප්පුවෙන්ද හෙනරත්ගොඩ බැන්ඩියමුල්ලේ ඩී. ජේ. සුබසිංහ අප්පුහාමියෙන්ද ලබාගන්ට පුළුවන්බව දතයුතුයි.

පොතක් ශත 25 යි, සියගණන් ගන්නා අයට අඩු කර දෙනුලැබේ.

ඩී. ජේ. සුබසිංහ අප්පුහා

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු